**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு**
**Ministry of Education, Higher Education and Vocational Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தர) உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026

සිංහල I
சிங்களம் I
Sinhala I

**71** **S** **I**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time -10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස්:**

❄ **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) හා (උ) යන උද්ධෘත අතුරෙන් **සතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) හා (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(අ) බුදුරජුන් වහන්සේ ද නකත්තරු පිරිවරා නික්මුණු සඳ පරිද්දෙන් මහණගණා පිරිවරා බමුණාණන්ගේ ගෙට වැඩ පනවන ලද බුදුහස්නෙහි යුගඳුරු මුදුනෙහි **වොරජනා** ළහිරුමඬලක් මෙන් වැඩහුන් සේක. භික්ෂුසංඝයා වහන්සේ ද රන්නැවක් මධ්‍ය කොට පිපී වැනී ගිය රත්නෙළුම් වනයක් මෙන් වැඩහුන් සේක. බමුණාණෝ ද බුදුපාමොක් සංඝයා වහන්සේ සිය අතින් සකස්කොට වැළඳ වූ ය. එදවස් මිථ්‍යාදෘෂ්ටිකයන්ගෙනුත් සම්‍යක්දෘෂ්ටිකයන්ගෙනුත් බොහෝදෙන රැස් වූ ය. මේ දෙපක්ෂයෙන් මිථ්‍යාදෘෂ්ටිකයෝ 'මේ බමුණාණන් ආරාධනා කොට ශ්‍රමණභවත් ගෞතමයන් ගෙට ම කෙළේ නම් හුදෙක් දන් දෙන්ට මතු නො වෙයි. ප්‍රශ්න විචාරා වෙහෙස දෙන්නට ය. ශ්‍රමණභවත් ගෞතමයන්ට වන සිලගු බලම්හ'යි රැස් වූ ය. සම්‍යක්දෘෂ්ටිකයෝ 'අද වුකලී මේ සම්‍යක් සම්බුද්ධ නැමැති සූර්ය තෙමේ සැදැහැ නැති බමුණාණන්ගේ මිථ්‍යාදෘෂ්ටි නැමැති අඳුරු හරවනු නිසා දේශනා නැමැති ආලෝකයත් ශරීරාලෝකයත් එක් කොට යහපත් පැයක් ගන්නට වයිති හනන්නා සේ අද ආලෝක දෙකක් විහිදුවයි. අපිත් ගොසින් ඒ ආලෝකයෙන් කෙලෙස් අඳුරු දුරු කරම්හ'යි 'සර්වඥවිලාස නැමැති රසාඤ්ජනය ඇස ගාම්හ'යි රැස්වූහ. බමුණාණෝ ද වළඳවාලා අන්තයෙහි බුදුන් කරා එළඹ මිටි හස්නෙක හිඳ ප්‍රශ්න විචාරන්ට පටන් ගත්හ.

(i) මිථ්‍යා දෘෂ්ටිකයන් මෙම ස්ථානයට පැමිණියේ කුමක් අරමුණු කර ගෙන ද?
(ii) මෙහි සඳහන් පරිදි යහපත් පැහැයක් ගැනීමට හේතු වූ ආලෝක දෙක මොනවා ද?
(iii) **"සර්වඥවිලාස නැමැති රසාඤ්ජනය ඇස ගාම්හ"** මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'වොරජනා'** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(ආ) තව ද බරණැස අනික් සිටුපුත්‍රයාණකෙනෙකුන්ට ද අන්තරගණ්ඨී නම් ආබාධයෙක් ඇති විය. හේ කෙසේ වූ ආබාධයෙක් ද යත්, ඒ සිටාණන් තරුණ කල කරණම් පැන ක්‍රීඩාවක් කරන දවසෙක බඩවැල උඩට නැගී මධ්‍යයෙහි දී ගැටගැසී ගිය. ඒ කාරණයෙන් සිටාණන් අනුභව කළ යම් දෙයක් බඩවැලින් මලමාර්ගයට යා නොහැකි හෙයින් පාකයටත් නොයෙයි, මල මූත්‍රයෙක් තමා ම නැත. එක් වේලෙක අනුභව කළ දෙයක් එක් වේලෙක නහාපියා ජීවිතය රක්ෂා කෙරෙති. එකල සිටාණෝ **ශුෂ්කකාෂ්ඨයක්** සේ වියළී දවසින් දවස වැහැර පඬුවන් ව ගියහ. තෙල්පතක් වැළැන්දා සේ සර්වාංගයෙහි ධමනි පෙනෙන්නට පටන්ගත. එපවත් අසා දඹදිව බොහෝ වෙදවරු අවුත් අවස්ථා නො දැන විෂම ප්‍රතිකාර කොට සමනයක් කොට ගත නොහී යන්නාහු ම ය. "සිටාණන්ගේ ගෙට අපි අපි ය" යි වාසි කියකියා මුළු බැඳ එන වෛද්‍යාචාරීන් විසින් හා පිළියම් කොට සමනයක් කොටගත නොහී "අපට බැරිය, අපට බැරිය" යි කියා ආපස්සේ යන වෙදවරුන් විසින් හා උන්ගේ වාසල්දොර අතුරු නැතියේ ය.

(i) අන්තරගණ්ඨී නම් ආබාධය නිසා සිටුපුත්‍රයාට ඇති වූ රෝග ලක්ෂණ කවරේ ද?
(ii) සිටාණන්ගේ වාසල් දොර අතුරු නැති වූයේ කවර හෙයින් ද?
(iii) "**තෙල්පතක් වැළැන්දා සේ සර්වාංගයෙහි ධමනි පෙනෙන්නට පටන්ගත**" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'ශුෂ්කකාෂ්ඨයක්'** යන්නට කෙටි විවරණය සපයන්න. (ලකුණු 04 යි.)

(ඉ) චුල්ලධනුද්ධරයෝ තමන්ගේ බිරින්ද කැඳවා ගෙන මාවතක යන්නාහු වනාන්තරයකට පැමිණියාහ. ඒ වනාන්තරයේ භයංකර වූ **ත්‍රිමදගලිත** හස්තියෙක් ඇත. ඒ හස්තියා ධනුද්ධරයන් දැක දිව ගෙන ආ ය. චුල්ලධනුද්ධරයෝ පංචායුධ සන්නද්ධ ව ඊ දඬු පන්සියයකුත් ඇර ගෙන යන්නාහු හස්තියා දිව ගෙන එන්නා ඊදණ්ඩක් ඇද පියා ඇරගෙන විද්දාහු වාත කුම්බයෙන් වැද පලවා ඇතා එතන ම එළා නික්මුණු කලට, අනික් වනාන්තරයක සොරුන් පන්සියයක් දඩ මස් මරා පුළුස්සා කන කලට චුල්ලධනුද්ධරයෝ එතනට පැමිණ තමන් බිරින්දට කියන්නාහු "දඩ මස් පුළුස්සා කන මිනිසුන් උන් තෙනට ගොස් දඩමස් ඉල්වා ගෙන එව"යි කියා යවූහ. ඒ කියන සොරු පිළිස්සු දඩ මස් නොදී අමු මාංශ දී යවූහ. චුල්ලධනුද්ධර කුමාරයෝ අමු මාංශ දැක කියන්නාහු "පිළිස්සු මාංශ නොදී අමු මාංශ දුන්නේ අප කෙරේ කනස්සලුවෙන්දැ?"යි කියා දෙවැනි ව බිරින්ද අත අමු මාංශ යවන්නා සොරු පන්සියය කෝපවන. එකෙක් "අප පන්සියය වෙහෙසයිදැ"යි කියා කෝපයෙන් දිවුවා වූ චුල්ලධනුද්ධරයෝ එකින් එකාට සොරු පන්සියය එකක් අඩු ඊ දඬු පන්සියයෙන් විද එළූහ. සොරුන් නායක තැනැත්තේ ඉවත් ව සිට අවුත් චුල්ලධනුද්ධරයන් අල්වා ගත. සොරදෙටුවා හා චුල්ලධනුද්ධරයන් හා උනුන් කා සොරා යට කොට ඔබා ගෙන චුල්ලධනුද්ධරයෝ "සොඳුර කඩුව දී ලව"යි අත දික් කොට ලන්නා සොරාට කඩු මිට දී චුල්ලධනුද්ධරයන්ට කොපුව දීලූහ.

(i) සොරුන් පන්සියය කෝපයට පත්වීමට හේතුව කුමක් ද?
(ii) චුල්ලධනුද්ධර සතුව සොර මුළෙහි නායකයාට විදීමට ඊතලයක් නොමැති වූයේ ඇයි?
(iii) **"සොරදෙටුවා හා චුල්ලධනුද්ධරයන් හා උනුන් කා සොරා යට කොට ඔබා ගෙන"** මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'ත්‍රිමදගලිත'** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(ඊ) ඒ අසා කුමාරිකාවෝ මැණියන්ට කිපී "චණ්ඩාල කෙලී නම් තෙපි ම යැ" යි කියා තමන් මැණියන්ට බිණූහ. මෙසේ ඒ කුමාරිකාවෝ මෙපමණ කුසල් අකුසල් කොට මැත භාගයෙහි එයින් චුත ව දඹදිව උත්තර මධුරා නම් නුවර වීණා ගායනා කරන එක්තරා චණ්ඩාල බ්‍රාහ්මණයක් හට දූ ව උපන්හ. එකල්හි පළමු කළ ප්‍රාර්ථනා වූ පරිද්දෙන් විශිෂ්ට වූ රූ ඇති වූහ. ඔවුන්ගෙ සියලඟින් විදුලිය කලඹක් වැනි රශ්මි මාලා සමූහයෝ නික්මෙති. හාත්පසින් සතර රියන් පමණ තන්හි ශරීරාලෝකයෙන් ම අන්ධකාර දුරු ව ඒකාලෝක වෙයි. මුඛයෙන් මහනෙල් මල් සුවඳ හමා බස්සී. ශරීරයෙන් සඳුන් සුවඳ වහනය වෙයි. ඔවුන් දෙතන මැද රන්වන් වූ තිලකාභරණයක් මැවිණ. ඒ තිලකාභරණයෙන් අභිනව **බාලාර්ක** මණ්ඩලය සේ රශ්මි සමූහයෝ නික්මෙති. ඒ කුමාරිකාවන් දුටු දුටු පුරුෂයෝ බොහෝ සේ ම උමතු වූවන් මෙන් කාමයෙන් මත් ව විසංඥ වෙති. අහෝ කුසලාකුසල කර්මයන්ගේ ආනුභාවය නම් ඉතා නොසිතිය හැක්කේ මැ යි. ඒ එසේ මැ යි. ගිය ජාතියෙහි ඒ කුමාරිකාවෝ යම් ක්‍රෝධයක් හේතු කොට ගෙන තමන් වැදූ මැණියන්ට 'චණ්ඩාල කෙල්ල යැ'යි බිණුවාහු ද ඒ අකුසල කර්මය නිසා උත්තම ජනයන් විසින් පිළිකුල් කටයුත්තා වූ හීන ජාතියෙහි චණ්ඩාල ව උපන්හ.

(i) මවට පරිභව කිරීම නිසා කුමාරිකාවට අත් වූ විපාකය සඳහන් කරන්න.
(ii) කුමාරිකාව දුටු දුටු පුරුෂයන්ට සිදු වූයේ කුමක් ද?
(iii) **"සියලඟින් විදුලිය කලඹක් වැනි රශ්මි මාලා සමූහයෝ නික්මෙති"** මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'බාලාර්ක'** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(උ)

දිය දිය ගොස පළ කෙරෙමින් සපැමිණි
ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණි
ගිය ගිය දියනද එන මෙන් ගෙන මිණි
සිය සිය ගුණයෙන් වෙණ නද නික්මිණි

පියසන් නොව බිඟුදැල් රැඳි කොපුලී
අවසන් නොව වෙණ නදට ම **කුහුලී**
මද සන්සුන් පියොවින් සිටි නොසැලී
ගජසෙන් සිතියම් ගජ සිරි කියෙලී

(i) වීණා නාදය අසමින් සිටි ඇත් සේනාව දිස් වූයේ කවර විලාසයකින් ද?
(ii) පළමු වන පද්‍යයේ දැක්වෙන කාව්‍යාලංකාරය කුමක් ද?
(iii) "පියසන් නොව බිඟුදැල් රැඳි කොපුලී" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) "කුහුලී" යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

[තුන් වැනි පිටුව බලන්න.]

• (ඍ) සහ (එ) ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.

(ඍ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක අවස්ථා සම්බන්ධය** දක්වන්න.

(i) "පළමුව මෙසේ වූ කටයුත්ත කොට මෙසේ වූ දුකකට පැමිණියෙමි."
(ii) "උන් දැන් නො එන්නේ තුන් අවුරුද්දෙක"
(iii) "තෙලෙ සම්පත තොපට ම දුනුම්හ."
(iv) "දඹ අත්ත මැඩ වුවා සේ ම අප හා වාදත් කළ මැනව."
(v) "ඔය අදහසට මට කොහොම වත් කැමති වෙන්න බැහැ."
(vi) "උඹ මොකට ද මේ වෙලාවේ ආවේ? හෙට වරෙන්. මට මේ රෑ මොන වැඩක් වත් කරන්ඩ බෑ."
(vii "හුදකලාව සිටිය හැකි ද
පාළුබවක් නොම දැනේ ද"

(ලකුණු 03 ×4 = 12යි.)

(එ) වස්තු විෂය හා කාව්‍ය භාෂාව කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක් කරන්න .

මඟුල් ගීය

මල් ගොමු ගුමු ගුමු ගන්වන්නී
මී වදවලැ පැණි පුරවන්නී
කුරුලු සරින් කන් පිනවන්නී
මුළු ලොව උයනක් කරවන්නී

ජම්බු ගහට රත පොරවන්නී
බක්මී ගහ කහ අන්දන්නී
අඹ දලු ළා රත තවරන්නී
ලෝ කත විසිතුරු කැරැලන්නී

එරබදු පැහැයෙන් දුලවන්නී
නා ගස් සුවඳින් බැඳලන්නී
විලේ නෙළුම් මල් පොබයන්නී
නෙත ගිය ගිය අත පණවන්නී

ගමේ මැ පුහුලන් ඉදවන්නී
සොරුන්බවට වවුලන් ලන්නී
නෙතැනැ වවුලු පළවල් දෙන්නී
ගම් දරුවන් හට වැඩ දෙන්නී

මල්සර හට හී සපයන්නී
යොවුනන් සිත් ඉන් බැඳලන්නී
දෙක දෙක එක් කැරැ ඇඳන්නී
නොමිලේ කපු කම් කරවන්නී

වෙන් වුවන් සිත කලඹන්නී
පැරැණි තරහ හැම යට ලන්නී
ආයෙත් එකමුතු කරවන්නී
පවුල් අවුල් විසඳාලන්නී

කොල්ලන් කෙල්ලන් පොබයන්නී
මහලු සිතෙත් කෙළි රිසි ලන්නී
ගෙයි ගෙයි බක් වෙස් ගන්වන්නී
අවුරුදු කිරිබත උයවන්නී

දස දෙස සුවඳින් බැඳැ ලන්නී
ගතට සිතට නව පණ දෙන්නී
කුඹුරට ආසිරි සලසන්නී
රට වටැ සොම්නස ගෙනැ යන්නී

සිසිර කුමරි පස්සට ලන්නී
ගිම් කුමරිට පෙරටුවැ එන්නී
දිනිසුරු කුමරුට අත දෙන්නී
ලොවට මැ මඟුලක් සලසන්නී

(ලකුණු 12 යි.)

2. "ධර්මසේන හිමියන් සද්ධර්මරත්නාවලියෙහි කතා පුවත් රසවත් කිරීමටත් චරිතවල මනෝභාව සහ අභ්‍යන්තර ගැටුම් තීව්‍ර කිරීමටත් සංවාද අවස්ථා මැනවින් භාවිත කර ඇත." නිර්දිෂ්ට කතා පුවත් ඇසුරෙන් උදාහරණ දෙමින් විමසන්න.

**නැතහොත්**

පුරුෂාධිපත්‍යය හේතුවෙන් ස්ත්‍රිය පීඩාවට පත් වන අන්දම නිර්දිෂ්ට ජාතක කථාවල අතීත කථා ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

3. අභියෝග ඉදිරියේ ගනු ලබන නිවැරදි තීරණ ජීවිතයක සාර්ථකත්වයට හේතු වන අන්දම පූජාවලියේ නියමිත කථා වස්තු ඇසුරෙන් විමසන්න.

**නැතහොත්**

පුද්ගල හැසිරීම්වල යථා ස්වභාවය මැනවින් නිරූපණය කිරීම මගින් කතා රසය උද්දීපනය කර ඇති අයුරු සද්ධර්මාලංකාරයේ නියමිත කථා වස්තු ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

4. (අ) "කෝට්ටේ සාහිත්‍ය අවධිය වැදගත් වනුයේ නවාංග සහිත ව පද්‍ය සාහිත්‍යයේ සිදු වූ වර්ධනය නිසා ය." විමසන්න.

(ලකුණු 07යි.)

(ආ) "සැළකෙළි සෞන්දර්යය චමත්කාර ලෙස නිරූපණය කිරීමට ගුත්තිල කවියා සතුව පැවති සාමර්ථ්‍යය විශිෂ්ට ය." සැළකෙළි වැනුමෙන් නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 08 යි.)

5. "නූගත්කම ජීවිතයේ බොහෝ ව්‍යසනවලට හේතු වන ආකාරය බැද්දේගම නවකතාවෙන් නිරූපිත ය." නිදසුන් **තුනක් වත්** දක්වමින් විමර්ශනය කරන්න. (ලකුණු 15 යි.)

6. "ජීවිතය හා පොර බදන අනේකවිධ පීඩාවලට නතු වූ මිනිස් චරිතවල ගති සොබා නූතන කෙටිකතාවල මනා ව නිරූපණය කර ඇත්තේ ය."නිර්දිෂ්ට කෙටිකතා ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15 යි.)

7. "මිනිසාට අත්විඳීමට සිදු වන දුක්ඛදායක සංසිද්ධි කාව්‍යාත්මක ප්‍රකාශයන්බවට පත් කිරීමට නූතන කවීහු සමත් වෙති." නිදහස් කවියේ ද්විතීය තරංගයේ කවීන්ගේ නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණ ඇසුරෙන් මේ පිළිබඳ විමසන්න.
(ලකුණු 15 යි.)

8. ආත්මාර්ථය සියලු විනාශයන්ට මුල් වන ආකාරය 'පෙමතො ජායතී සොකො' නාට්‍ය පෙළ ඇසුරෙන් උදාහරණ තුනක් වත් ගෙන හැර දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)

***

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
**Ministry of Education, Higher Education and Vocational Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தர) உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026

සිංහල II
சிங்களம் II
Sinhala II

**71** **S** **II**

***පැය තුනයි***
***மூன்று மணித்தியாலம்***
***THREE HOURS***

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

- **අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**
- I කොටසේ 1ප්‍රශ්නය ද, II කොටසේ 2,3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- 1 ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මේ **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

## I කොටස.

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 තාලුජ අක්ෂර පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ක, ච, ඤ, න, බ, ය, ව
(2) ච, ඡ, ජ, ශ, ඣ, ය, ඤ
(3) ච, ට, ඨ, ත, ද, ග, ස
(4) ඵ, ෂ, ළ, ඹ, හ, ල, ශ
(5) ජ, ය, න, ච, බ, ස, ජ (.........)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) දෘෂ්ටිය, සාම්ප්‍රධායික, විෂ්කම්භය, ඓශ්වර්ය, මර්ධනය
(2) දෘශ්ටිය, සම්ප්‍රදායික, විෂ්කම්භය, ෛඓශ්වර්ය, මර්දනය
(3) දෘශ්ඨිය, සාම්ප්‍රදායික, විෂ්කම්භය, ඓශ්වර්‍ය, මර්ධණය
(4) දෘෂ්ටිය, සාම්ප්‍රදායික,විස්කම්බය, ඓශ්වර්ය, මර්ධනය
(5) දෘෂ්ටිය, සාම්ප්‍රදායික, විෂ්කම්භය, ඓශ්වර්ය, මර්දනය (.........)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) ආභරණ, ජීවනෝපාය, සෘජුකෝණය, වෘත්තිය,ව්‍යවසාය
(2) සෘජුකෝණය, ආභරණ, ව්‍යවසාය, ජීවනෝපාය, වෘත්තිය
(3) සෘජුකෝණය, ජීවනෝපාය, ආභරණ, ව්‍යවසාය, වෘත්තිය
(4) ආභරණ, සෘජුකෝණය, ජීවනෝපාය, වෘත්තිය, ව්‍යවසාය
(5) ආභරණ, ජීවනෝපාය, සෘජුකෝණය, ව්‍යවසාය, වෘත්තිය (.........)

1.4 පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) විසර්ගය ව්‍යඤ්ජනාක්ෂරයක් ලෙස සැලකේ.
(2) විසර්ගය ස්වරයකට පූර්වයෙන් යෙදේ.
(3) අනුස්වාරය නමින් හැඳින්වෙන්නේ ද විසර්ගයයි.
(4) ‘හ්’ ශබ්දය වෙනුවට විසර්ගය ද යෙදිය හැකි ය.
(5) තද්භව වචනවල විසර්ගය බහුල ව යෙදේ. (.........)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) විද්‍යා ප්‍රබන්ධ, හැරවුම් ලක්ෂ්‍යය, දෙටු පුත්, දිවුරුම් ප්‍රකාශ
(2) ක්‍රීඩා උලෙළ, වත්මන් පරපුර, කම්කරු ප්‍රශ්න, ලෝ දහම
(3) ආර්ය මාර්ගය, අබිරහස් කතා, මූල්‍ය විනය, ප්‍රාණ අක්ෂර
(4) ස්ථාවර තැන්පතු, තැගි භාණ්ඩ, දේහ ලක්ෂණ, පුහුණු ශ්‍රමය
(5) ක්ෂණික ඇමතුම්, කීර්ති සෝෂාව, අධිවේගී මාර්ග, බණ කථා (.........)

[දෙවැනි පිටුව බලන්න.]

1.6 **තත්සම පද** පමණක් යෙදී ඇති වරණය කුමක් ද ?
(1) සෝස, හාස, දැස, තෝස
(2) උදාර, ප්‍රහාර, විහාර, ආහාර
(3) ගරු, විරු, සුරු, බොරු
(4) සීමා, තේමා, කමා, නිමා
(5) තරුණ, වරුණ, ඉරුණ, අරුණ (.........)

1.7 **තද්භව වචන** පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) කාය, පාය, නාය, සැය
(2) ධන, ගන, පණ, සෘණ
(3) වැසි, දැසි, රාසි, අසි
(4) රාහු, ලුහු, කොහු, බහු
(5) අවර, නුවර, ඇවර, විවර (.........)

1.8 අන්‍යාර්ථ, දකාරාර්ථ, විශේෂණ, විභක්ති යන සමාස පද **අනුපිළිවෙළින් දක්වා ඇති වරණය** තෝරන්න.
(1) නැණපහන, සගමොක්, බරනෙත්, බිඟුනද
(2) සගමොක්, බිඟුනද, නැණපහන, බරනෙත්
(3) බිඟුනද, නැණපහන, බරනෙත්, සගමොක්
(4) බරනෙත්, සගමොක්, නැණපහන, බිඟුනද
(5) නැණපහන, බරනෙත්, බිඟුනද, සගමොක් (.........)

1.9 කෘදන්තයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) ශ්‍රැත, මෘත, කෘත, භූත
(2) පානීය, මානනීය, ශෝචනීය, කමනීය
(3) පැරුණු, දරුණු, පිරුණු, වැහැරුණු
(4) ඉසිනය, රඳවනය, ඔසවනය, දවටනය
(5) ධරමාන, ශෝභමාන, විද්‍යමාන, විරාජමාන (.........)

1.10 පහත දැක්වෙන උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(අ) "අඳුරු **ලලා** සෙන්කඩගල වහින්නා"
(ආ) "**ඇවිදින්** දද මහලු"
(ඉ) "**පිහිනත** උඩුකුරු වෙමිනහනන් ගඟ"
(ඊ) "**වඩිනුව** පා පියුම් පෙති"
(1) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා
(2) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අපර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
(3) මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා, පූර්ව ක්‍රියා
(4) අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(5) මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, අපර ක්‍රියා (.........)

1.11 තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) සංහිඳියා, රැකියා, හැකියා, නිහැඬියා
(2) සප්තම, පඤ්චම, දශම, නවම
(3) සිල්වත්, නියවත්, ආදර්ශවත්, පෙම්වත්
(4) කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ, ධර්මිෂ්ඨ, පාපිෂ්ඨ
(5) ප්‍රියතම, උච්චතම, උත්තම, දීර්ඝතම (.........)

1.12 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) අපහරණ, අපද්‍රව්‍ය, අපයෝජන, අපවාද
(2) විමති, විතැන්, විහඟ, විදෙස්
(3) ප්‍රමාණ, ප්‍රබන්ධ, ප්‍රගති, ප්‍රකෝප
(4) නිසල, නිවත්, නිබඳ, නිදොස්
(5) සංගීත, සන්තාප, සංග්‍රහ, සත්පුරුෂ

1.13 නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) අහා, අනේ, ඔහෝ, අපොයි
(2) සෙද, වයි, නොලසා, වහා
(3) සදිසි, එව්, බඳු, වන්
(4) විසින්, කෙරෙන්, මෙයින්, කෙරෙහි
(5) පිණිස, උදෙසා, නිසා, අරභයා (.........)

[තුන් වැනි පිටුව බලන්න.]

1.14 “ඉගෙනුම් ඉගැන්වීම් **ක්‍රියාවලිය** සඳහා **නූතන** තාක්ෂණයෙන් **ප්‍රබල** මෙහෙවරක් සැපයේ.” යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් දක්වා ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) සන්ධි, සමාස, තද්ධිත
(2) සමාස, තද්ධිත, සන්ධි
(3) තද්ධිත, සන්ධි, සමාස
(4) තද්ධිත, සමාස, සන්ධි
(5) සන්ධි, තද්ධිත, සමාස (.........)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) වයති, ගයති, ලියති, සොයති
(2) කැවෙමු, ලදිමු, කියමු, දුටුවෙමු
(3) වැටිණි, දැනේ, පෙනිණි, බැලිණි
(4) වපුළහ, කළේ ය, විචාළහ, හදාළහ
(5) පැන්නේ ය, යන්නේ ය, හුන්නේ ය, දන්නේ ය (.........)

1.16 සමාසයක් **නොවන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සියපත්, බටහිර, සහසකර, දසබල
(2) මීනනුවන්, සඳවත, කැවුම්මුණ, විල්කත්
(3) අපමණ, අසුර, අඳුර, අනිටු
(4) ගල්පඩි, සැත්කම්, ඉටිපහන්, කිරිබත්
(5) රන්රිදී, වැව්පොකුණු, අඹුදරු, ගම්බිම් (.........)

1.17 එක ම වර්ගයට අයත් සන්ධි පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) මහාචාර්ය, කාව්‍යෝක්ති, නින්දාලාප, විද්‍යාලය
(2) අනුරුත්, පෙරපර, අමයුරු, කුලඟන
(3) අධ්‍යක්ෂ, අත්‍යුදාර, ස්වේච්ඡා, පර්යේෂණ
(4) අස්සන, සද්දින, කම්මල, වප්පිහි
(5) යථෝක්ත, විවිධාංග, මහෝපාසිකා, භාෂෝද්ග්‍රහණ (.........)

1.18 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** වරණය කුමක් ද?

(1) ගර්ජන, තර්ජන, මර්දන, දූර්ජන
(2) සිවුහෙළ, සිවුසස්, සිවුදෙස්, සිවුදිග
(3) දූෂිත, භූෂිත, ධාරිත, දේශිත
(4) සැරසිලි, පැමිණිලි, දැහලිලි, සිතිවිලි
(5) නිකෙලෙස්, නිවහල්, නිවැරදි, නිසසල (.........)

1.19 ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

(1) නියෝජිතයෝ සියල්ලන් ම සාකච්ඡාවට පැමිණ සිටියහ.
(2) ඕ තොමෝ තරගයෙන් ජය ලබති’යි අපි සිතුවෙමු.
(3) ඔහු ලේඛකයකු මෙන් ම කවීකයකු ද වෙයි.
(4) දෙමවුපියන් ආදර්ශවත් වෙත් ද දරුවන් ද එමග යනු ඇත.
(5) ගොවියෝ ද කම්කරුවෝ ද රටේ සංවර්ධනයේ නියමුවෝ ය. (.........)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) නිදහසට හේතු කියා බේරෙන්න නොසිතන්න.
(2) හරියට වැඩ කළාම දියුණුව පෙනේවි.
(3) මා ඒ ගමන හෙට ම යා යුතු ය.
(4) මිනිස්සු ජීවන අරගලයට අසීරුවෙන් මුහුණ දෙනවා.
(5) රට ගොඩ නගන්න කවුරුත් මහන්සි වෙන්න ඕනෑ. (.........)

(ලකුණු 01×20යි)

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - 2026
General Certificate of Education (Adv.Level) Examination - 2026

**සිංහල II**
**சிங்களம் II**
**Sinhala II**

**71 S II**

## II - කොටස

- මෙම කොටසින් 2,3 ප්‍රශ්න ඇතුළු ව **ප්‍රශ්න හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

2. පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නව දාර්ශනික මතවාද හා ඥාන ගවේෂණය පිළිබඳ දාර්ශනිකයන්ගේ චින්තනය යුරෝපය තුළ පැතිර යැමත් සමග කලින් කලට යුරෝපීය භාෂා අධ්‍යයන ක්ෂේත්‍රයේ වෙනස්කම් ඇති වුව ද එම භාෂා සමීක්ෂා සිද්ධාන්තයන්හි අඩු ලුහුඬුකම් රැසක් විද්‍යාමාන විය. භාෂාවක කථා ව්‍යවහාරයට වඩා ලේඛනයට ප්‍රමුඛස්ථානය දීම, නිර්දේශාත්මක/උපදේශාත්මක ව්‍යාකරණ සිද්ධාන්ත ගුරු තන්හි තැබීම, භාෂාවක සංස්ථිතික ලක්ෂණ ප්‍රත්‍යක්ෂ ලෙස නො විමසා දාර්ශනික පදනම මත විමසීමට ලක් කිරීම, සැම භාෂාවක් ම ලැටින් භාෂාවේ ව්‍යාකරණ ආදර්ශයෙන් විමසා දැක්වීම ආදිය ඉන් කීපයකි. භාෂාව පිළිබඳ තත්කාලීන යුරෝපීය පඬුවන් දැරූ ආකල්ප නිසා එකල යුරෝපීය භාෂා අතර පැවති ඥාති සම්බන්ධය පවා විවරණය කිරීමට අවධානය යොමු නොවිණි.

සියවස් ගණනාවක් මුළුල්ලේ යුරෝපයේ ප්‍රචලිත ව පැවැති භාෂා විෂයක දර්ශනය බොහෝ සෙයින් වෙනස් වන්නට වූයේ 18වන සියවසේ දී සංස්කෘත භාෂාව හා ව්‍යාකරණය පිළිබඳ දැනුම යුරෝපීය ප්‍රාඥයන් අතට පත්වීමෙන් පසුව ය. විශේෂයෙන් ම පාණිනීගේ 'අෂ්ටාධ්‍යායියෙන්' නිරූපණය වන සංස්කෘත ව්‍යාකරණය නිසා යුරෝපීය භාෂා සමීක්ෂා ක්‍රමය නව මුහුණුවරක් ගත්තේ ය. කල්පිත සිද්ධාන්ත මත නොව ප්‍රත්‍යක්ෂ තොරතුරු පදනම් කර ගනිමින් භාෂාව විග්‍රහ කිරීමේ ශික්ෂණයක් භාරතීය ව්‍යාකරණ සම්ප්‍රදාය මගින් යුරෝපීය පඬුවන්ට ලැබුණු අතර තුලනාත්මක ව භාෂාන්තර ඉතිහාසය අධ්‍යයනය කිරීමේ හැකියාව ද එමගින් ලැබිණ. 18වන සියවසේ අවසානය පමණ වන විට යුරෝපය තුළ ඥාති භාෂා සංකල්පය ප්‍රචලිත ව පැවැති අතර සංස්කෘත, ග්‍රීක් හා ලැටින් භාෂා අතරේ වූ ඓතිහාසික සම්බන්ධය මුල් වරට පැහැදිලි කරන ලද්දේ භාරතයට පැමිණි ඉංග්‍රීසි ජාතිකයකු වූ සර් විලියම් ජෝන්ස් (Williams Jones, 1746–1794) විසිනි.

(i) යුරෝපීය භාෂා අධ්‍යයන ක්ෂේත්‍රයේ වෙනස්කම් ඇති වූයේ කුමන සිදුවීමක් නිසා ද?

(ii) භාෂා සමීක්ෂා සිද්ධාන්තයන්හි අඩු ලුහුඬුකම් ලෙස මෙහි සඳහන් වන කරුණු අතුරෙන් දෙකක් දක්වන්න.

(iii) භාෂාව පිළිබඳ තත්කාලීන යුරෝපීය පඬුවන් දැරූ ආකල්පය නිසා සිදු වූයේ කුමක් ද?

(iv) යුරෝපයේ ප්‍රචලිත ව පැවැති භාෂා විෂයක දර්ශනය බොහෝ සෙයින් වෙනස් වන්නට වූයේ කුමන සිදුවීමකින් පසුව ද?

(v) යුරෝපීය භාෂා සමීක්ෂා ක්‍රමය නව මුහුණුවරක් ගැනීමට හේතු වූයේ කුමක් ද?

(vi) භාරතීය ව්‍යාකරණ සම්ප්‍රදාය මගින් යුරෝපීය පඬුවන් ලත් ප්‍රයෝජන දෙකක් ලියන්න.

(ලකුණු 2 × 6 = 12යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

දහසය වන සියවස ආරම්භ වන විට මෙරට පැවති දේශපාලන පසුබිම පිළිබඳ විග්‍රහ කරමින් මහාචාර්ය ලෝනා දේවරාජා, පෘතුගීසින් ප්‍රථම වරට ශ්‍රී ලංකාවට පැමිණෙන විට එකිනෙකට වෙනස් දේශපාලනික හා ආර්ථික වැදගත්කමකින් යුත්ත වූ රාජ්‍යයන් තුනක් රට තුළ වූ බව දක්වයි. ඒවා නම් කෝට්ටේ, යාපාපටුන හා කන්ද උඩරට වශයෙනි. මෙම රාජ්‍යයන් අතර කෝට්ටේ ඉතා විශාල ව ද බලසම්පන්න ව ද පැවතියේ ය. කලා ඔයේ සිට වලවේ ගඟ දක්වා පැතිරී තිබුණු නිරිත දිග ප්‍රදේශය කෝට්ටේ රාජධානියට අයත් විය. එහි දෙනවක, තුන් කෝරළය, සතර කෝරළය, සත් කෝරළය හා මාතර ද යන ප්‍රධාන කොටස් පහ කෝට්ටේ රජු විසින් පත් කරන ලද පාලකයන් මගින් පාලනය කෙරිණි. එසේ එක් එක් ප්‍රදේශ ප්‍රාදේශීය පාලකයින් මගින් පාලනය වුව ද කෝට්ටේ රජතුමා ලංකාව පුරා ම නාමික ආධිපත්‍යයකට හිමිකම් කීය. පරම්පරා කිහිපයක් ලංකාවේ අධිරාජ්‍යයන් වශයෙන් ක්‍රියා කළ රජ පවුලකින් පැවතුණු කෝට්ටේ රජතුමාට 'ලංකාධීශ්වර', 'චක්‍රවර්ති' යනාදි විරුදයන් ව්‍යවහාර වූයේ එම නිසා ය. එමෙන් ම කෝට්ටේ රාජධානිය තුළ බලසම්පන්න රජවරුන් පාලනය කරන විට ලංකාවේ ඒ ඒ ප්‍රදේශවල පාලන කටයුතු මෙහෙයවූ ප්‍රදේශාධිපතිවරු ඔවුනට කප්පම් ගෙවූහ.

පෘතුගීසින් ලංකාවට පැමිණි කාලය වන විට ලක්දිව වෙළෙඳාම වැඩි වශයෙන් ම පාලනය කරන ලද්දේ මුස්ලිම්වරුන් විසිනි. ඔවුහු මෙරට පොල්, පුවක්, මුතු, මැණික් හා ඇතුන් ද මිලට ගත්හ. මුස්ලිම්වරුන් විසින් මිලයට ගත් වෙළෙඳ ද්‍රව්‍යයන් වැඩි වශයෙන් උපදවනු ලැබුවේ කෝට්ටේ රාජධානියට අයත් ප්‍රදේශයන්හි ය. කෝට්ටේ රාජ්‍යය ධනයෙන් ද ආඪ්‍ය විය. වී ගොවිතැන බහුල ව පැවැත්තේ එහි ය. තව ද තේ, රබර් සහ පොල්වලට ඇති වර්තමාන තත්ත්වය එදා අත්කර ගත් වෙළෙඳ භාණ්ඩ වූ කුරුඳු, පුවක්, අලි ඇතුන් හා මැණික් වැඩි වශයෙන් ලැබුණේ කෝට්ටේ රාජධානියට අයත් ප්‍රදේශවලිනි. මේ අයුරින් බලන විට පෙනී යන්නේ කෝට්ටේ රාජධානිය එකල පැවැති රාජ්‍යයන් අතරින් සැලකිය යුතු දේශපාලන බලයකින් ද ආර්ථික ස්ථාවරත්වයකින් ද යුක්ත වූ බවයි.

(ලකුණු 13යි.)

3. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300 - 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) බලවතුන්ගේ යුදකාමී මානසිකත්වය හමුවේ තීව්‍ර වන ලෝක අර්බුද
(ii) මානව ශ්‍රමයේ උපයෝගිතාව කෙරෙහි තාක්ෂණයෙන් ඇති කරන බලපෑම
(iii) නිෂ්පාදන ආර්ථිකයක් උදෙසා රටවැසියාගේ වගකීම
(iv) ශ්‍රී ලංකාවේ පෝෂණ ගැටලු සහ ළමා පරපුර
(v) නීතිගරුක සමාජයක පුරවැසියාගේ කාර්යභාරය

(ලකුණු 25යි.)

4. **(අ)** පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) කාන්තාවෝ කිහිප දෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩලයට බඳවා ගැනුණහ.
(ii) කෘමීහු වගා බිම් විනාශ කරති' යි ගොවියෝ මැසිවිලි නැගූහ.
(iii) වගකිවයුත්තෝ නිහඬ ව සිටින තාක් සමාජ දූෂකයෝ දුරාචාරයේ යෙදෙත්.
(iv) බුදුගොස් හිමි දිවයිනට පැමිණ හෙළටුවා පාලියට නැගූහ.
(v) පෙර දා වට වැස්සෙන් ගෙවල් දොරවල් හා මං මාවත් කැඩීබිඳී ගියහ.

**(ආ)** පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට හරවන්න.

(i) පන්තිභාර ගුරුතුමා බොහෝ දෙනා ඉදිරියේ මා පැසසුවේ ය.
(ii) මව සහ දුව උදෑසන ම මල් නෙළූහ.
(iii) විද්‍යාලයීය ශිෂ්‍ය නායකයෝ දේශකයාගේ අදහස් ඇගයීමට ලක් කළහ.
(iv) අපි පසුගිය ඉරු දින පෙරවරුවේ ගමේ විහාරස්ථානයේ දී නුඹලා දුටුවෙමු.
(v) කලවැද්දෙක් ලේනුන් ද කුඩුව ද ගසින් බිමට ඇද දමයි.

**(ඉ)** නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) කුමාරතුංග මුනිදාස මහතා ප්‍රවීණ (ලේඛකයෙක්/ලේඛකයෙකු) මෙන් ම ප්‍රකට සාහිත්‍ය (විචාරකයෙක්/විචාරකයකු) ද විය.

(ii) විභාගයෙන් ඉහළින් ම සමත් වූ (ශිෂ්‍යාශිෂ්‍යාවෝ/ශිෂ්‍යාශිෂ්‍යාවන්) ඇගයීම පිණිස පාසලේ විශේෂ උත්සවයක් (පැවැත්වෙයි./පැවැත්වෙති.)

(iii) පුස්තකාලය තුළ නිහඬ ව පොත් කියවමින් සිටි (දරුවා හෝ දැරිය/දැරිය හෝ දරුවා) පසෙක වැටී තිබූ පොතක් රාක්කයෙහි තැන්පත් (කළා ය./කළහ.)

(iv) (අපි/අප) එදිනෙදා කාර්යයන්හි දී පවා සතිමත් ව කටයුතු කළ (යුතු ය./යුත්තෝ ය.)

(v) (දෙමාපියන්/දෙමාපියෝ) තම රැකවරණය උදෙසා රැඳී සිටිති'යි කුඩා දරුවෝ අපේක්ෂා (කරත්./කෙරේ.)

(ලකුණු 05 × 3 = 15යි.)

**5.** පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු-අංගය දක්වන්න.

(i) **ප්‍රමුඛාචාර්යවරු ශිෂ්‍යසාධනය** විමර්ශනය **කරති**.
(ප්‍රමුඛාචාර්යවරු - සන්ධි, ශිෂ්‍යසාධනය - සමාස, කරති - ක්‍රියා)

(ii) මඳ **පවනින් සැලෙනා** ළා පත් පෙළ තුරු මුදුනේ **සුදිලෙයි.**
(පවනින් - විභක්ති, සැලෙනා - කෘදන්ත, සුදිලෙයි - උපසර්ග)

(iii) එතුමාගේ සැම **ගේය** පද සංකල්පනාවක් **පාසා** ම ගැමි දිවියේ සුවඳ ගැබ් **වී** ඇත.
(ගේය - ප්‍රත්‍යයාර්ථ නාම, පාසා - නිපාත, වී - ක්‍රියා)

(iv) **තා මෙයට** වරදකරුදැ'**යි** හෘද සාක්ෂිය ඔහුගෙන් විමසී ය.
(තා - නාම, මෙයට - විභක්ති, යි - නිපාත)

(v) **ගගනගාමීන් විසින්** නව **තාරකාවක්** නිරීක්ෂණය **කෙරිණි.**
(ගගනගාමීන් විසින් - විභක්ති, තාරකාවක් - තද්ධිත, කෙරිණි - කෘදන්ත)

(ලකුණු 03 × 5 = 15යි.)

6. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) ජාත්‍යන්තර යුද්ධ අපරාධ පිළිබඳ සත්‍ය තොරතුරු විදේශ ……….................... ප්‍රකාශයන්හි ඇතුළත් වේ'යැයි සිතීම මුළාවකි.

(ii) දහනව වන සියවසේ දී ජාතික උත්සවයක් ලෙස අලුත් සහල් ............................ ආරම්භ වී ඇත.

(iii) ස්වකීය ජ්‍යෙෂ්ඨ ....................... පැවිදි බිමට පත් වීම ගැන දෙමවුපියෝ මහත් සතුටට පත් වූහ.

(iv) නිවැරදි ................................. සමාජගත කිරීම ජනමාධ්‍යයන්හි ප්‍රධාන කාර්යභාරය වෙයි.

(v) මෙවර වප් ........................ රාජ්‍ය අනුග්‍රහයෙන් උත්කර්ෂවත් ව පැවැත්විණි.

(vi) මව සිය ................. ඇකයෙහි හොවා නැළවිලි ගී ගයමින් නිදි කරවයි.

(මඟුල, ප්‍රවෘත්ති, මංගල්‍යය, පුත්රුවන, පුවත්, පුත්‍රරත්නය)

(ලකුණු 1/2 × 6 = 03යි.)

(ආ). පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (i) | වැලි | + | අවුරු | (ii) | රනලිය | + | එව් |
| (iii) | පණ | + | අකුරු | (iv) | විද්‍යා | + | උදය |
| (v) | කිරිමැටි | + | ආන | (vi) | ප්‍රති | + | අන්ත |

(ලකුණු 1/2 × 6 = 03යි.)

(ඉ). **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල විභක්තිය නම් කරන්න.

(i) වඳුරා **වහලයෙන්** බැස **මිදුලෙහි** තිබූ කෙසෙල් කැන කා දැම්මේ ය.

(ii) **පොතපතින්** ලත් දැනුම **ඔහුගේ** භාෂා පරිඥානය දියුණු වීමට හේතු විය.

(iii) **ආදිශිෂ්‍යයන්** විසින් සංවිධානය කරන ලද විශේෂ උත්සවයක දී ජ්‍යෙෂ්ඨ **ගුරු භවතුන්ට** උපහාර පිරිනමන ලදි.

(ලකුණු 1/2 × 6 = 03යි.)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

අහෝ සුන්දර සන්ධ්‍යාවක නිහඬබව බිඳ ගෙන කඳු මුදුනෙන් ඇසෙන්නේ කුමන නාදයක් ද විහඟුන්ගේ කවබවය ද ඇදහැලෙන දිය දහරක ගොසගොසය ද ඔහු විස්මයපත් ව විචාළේ ය.

(ලකුණු 1/2 × 6 = 03යි.)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "මම හෙට අනිවාර්යයෙන් කොළඹ යනවා"යි දයාසේන කීවේ ය.
(ii) ගුරුවරයා සිසුන් දෙස බලා "ලබන සතියේ වාර විභාගය පැවැත්වෙනවා" යැයි කී ය.
(iii) "අද අහස හරිම ලස්සනයි" දරුවෝ කීහ.

(ලකුණු 01 × 3 = 03යි.)

7. පෙරදිග භාෂා ශාස්ත්‍රයට අනුව බලන කල පුරාණෝක්තිය ගුරු වෘත්තියෙහි ප්‍රයෝගයක් වශයෙන් ද සැලකේ. ව්‍යාසකාරය, හිතෝපදේශය, **ලෝකෝපකාරය**, වැනි කෘතීන් නිදසුන් වශයෙන් ගත හැකි ය. පුරාතන ගුරුවරුන් හා පඬිවරුන් කිසියම් කථාවක් (ප්‍රවාදයක්) පවසා ඒ කථාවෙන් එළි වන මුඛ්‍ය **චින්තාව** වගන්තියකට නැඟීම එක් සාම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රමයක් විය. ඒ **විධික්‍රමය** වඩාත් විසිතුරු අයුරිනුත් වඩාත් **නිර්මාණාත්මක** අයුරිනුත් මුදුන් පමුණුවා ගැනීමෙනුත් ශාස්ත්‍ර ඥානයේ චිරස්ථායිභාවය රැඳී පැවතිණ. බුදුන් වහන්සේ පවා අනුගමනය කළේ ඒ රීතියයි. මේ හේතුවෙන් පුරාණෝක්තිය, **සම්භාව්‍ය** කෘතීන් තුළට ප්‍රවේශ වීම සිදු වූ බව අපගේ නිගමනයයි. ධර්මප්‍රදීපිකාව, බුත්සරණ, ගුත්තිලය, පුරාණෝක්ති **සාගරයක්** වශයෙන් සැලකිය හැක්කේ ඒ පදනම මත පිහිටා ය. සම්ප්‍රදායානුකූල ව ධර්මප්‍රදීපිකාව හැදෑරීමෙන් ලබන ආස්වාදයට වැඩි **ආස්වාදයක්** පුරාණෝක්ති අධ්‍යයන වශයෙන් තත් කෘතිය හැදෑරීමේදී දැනිණ. ගුත්තිලය කාව්‍යයක් වශයෙන් අග්‍රගණ්‍ය කෘතියක් වීමට එක් ප්‍රධාන හේතුවක් වශයෙන් අපට පෙනී යන්නේ එහි අන්තර්ගත පුරාණෝක්ති සමුදාය ය. ඩබ්ලිව්. එෆ්. ගුණවර්ධන, මුනිදාස කුමාරතුංග වැනි ප්‍රාමාණික පඬිවරු මේ පුරාණෝක්ති සමුදාය හඳුන්වා දුන් පුරෝගාමී උගත්තු වූහ.

(i) තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් පෙළගස්වා ලියන්න.
(ii) **හිතෝපදේශය, ගැනීමෙන්, මුනිදාස** යන වචනවල යෙදී ඇති පිළි හඳුන්වන්න.
(iii) මෙම ඡේදයේ ඇතුළත් **තද්ධිත පද තුනක්** උපුටා දක්වන්න.
(iv) **පුරාණෝක්ති, බුත්සරණ, උගත්තු** යන වචන විසන්ධි කරන්න.
(v) **ඝෝෂ ඌෂ්මාක්ෂරයක් හා අර්ධ නාසිකාක්ෂරයක්** ඇතුළත් වචනයක් මෙම ඡේදයෙන් උපුටා ලියන්න.

(ලකුණු 03×5=15යි.)

8. පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) අල්පප්‍රාණ අක්ෂර
(ii) අන්‍යාර්ථ සමාසය
(iii) නිත්‍ය බහු වචන
(iv) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා
(v) ද්විත්ව රූප සන්ධිය

(ලකුණු 05×3=15යි.)


***

# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

## අ.පො.ස. (උ.පෙළ) උපකාරක තක්සේරුව - 2026

## සිංහල

### ලකුණු දීමේ පටිපාටිය



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව - 2026

## සිංහල

## ලකුණු බෙදී යාම

## I පත්‍රය

මේ ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් සමන්විත ය. පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

**පළමු ප්‍රශ්නය -** මේ ප්‍රශ්නය (අ), (ආ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ) යනුවෙන් කොටස් හතකින් 07 සමන්විත ය.

- (අ), (ආ), (ඉ), (ඊ), (උ) අවබෝධය - ලකුණු 16 යි. (4×4 = 16 යි)

(මේ කොටස් පහෙන් හතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)

- (ඌ) අවස්ථා සම්බන්ධය - ලකුණු 12 යි. (3×4 = 12 යි)

(i,ii,iii,iv,v,vi,vii මේ කොටස්වලින් අවස්ථා සම්බන්ධ හතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)

- (එ) රසාස්වාදය - ලකුණු 12 යි.

**ලකුණු 40 යි.**

අංක 02 සිට 08 තෙක් ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් සකසා ඇත. ඒ අතුරෙන් හතරකට (04) පිළිතුරු සැපයිය යුතු වේ. එක් ප්‍රශ්නයකට 15 බැගින් ලකුණු 60 කි. (4 වන ප්‍රශ්නය (අ) (ආ) යනුවෙන් කොටස් දෙකකි. (අ) කොටසට 07 කි. (ආ) කොටසට ලකුණු 08 කි.)

| | | |
|---|---|---|
| පළමු ප්‍රශ්නය | 16 + 12 + 12 | = 40 |
| 02 – 08 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න 04 ක් සඳහා | 15 × 4 | = 60 |
| | | **100** |

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව - 2026

## සිංහල

## ලකුණු බෙදී යාම

## II පත්‍රය

| | | |
|---|---|---|
| I කොටස (පළමු ප්‍රශ්නය) | මෙම ප්‍රශ්නය වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 20 කින් සමන්විත ය.<br>ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. මෙහි එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 20 කි. | |
| II කොටස | මෙම කොටස ප්‍රශ්න 07 කින් සමන්විත වේ. දෙවන හා තෙවන ප්‍රශ්න අනිවාර්ය වන අතර සම්පූර්ණ 04 කට පිළිතුරු සැපයිය යුතු ය. | |
| 02 ප්‍රශ්නය | අවබෝධය | - ලකුණු 12 ($02 \times 6 = 12$) |
| | සාරාංශය | - ලකුණු 13 ($02+03+08 = 13$) |
| 03 ප්‍රශ්නය | රචනය | - ලකුණු 25 |

04 වන ප්‍රශ්නයේ සිට 08 ව ප්‍රශ්නය තෙක් පිළිතුරු සඳහා

**(II වන පත්‍රය සඳහා මුළු ලකුණු $20 + 25 + 25 + 15 + 15 = 100$ )**

| | | |
|---|---|---|
| අවසාන ලකුණු ගණනය කිරීම | I පත්‍රය | = 100 |
| | II පත්‍රය | = 100 |
| අවසාන ලකුණු | = 200 ÷2 =100 | |

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
**අ.පො.ස. (උ.පෙළ) උපකාරක තක්සේරුව -2026**

**සිංහල I පත්‍රය**
**ආදර්ශ උත්තර හා ලකුණු දීමේ පටිපාටිය**

1.
(අ)

I. බමුණා අසන ප්‍රශ්න නිසා ශ්‍රමණභවත් ගෞතමයන්ට සිදු වන වෙහෙස/ පීඩාව/ අවනම්බුව/මදිපුංචිකම බැලීම සඳහා ය.
II. දේශනා නැමැති ආලෝකය සහ ශරීරයෙන් විහිදෙන ආලෝකය
III. බුදුන්ගේ රුව නැමැති රසඳුන ඇසෙහි තවරා ගනිමු/ආලේප කර ගනිමු/ ගා ගනිමු.
IV. බබළන්නා වූ.

(ලකුණු 04)

(ආ)

I. ආහාරයට ගත් දෙයක් බඩවැල් ඔස්සේ මල මාර්ගයට නොයාම ජීර්ණය / දිරවීම සිදු නොවීම, මල මුත්‍ර පිට නොවීම.
II. වහසි බස් කියමින් (හැකිකම් ප්‍රකාශ කරමින්) සමූහ (කණ්ඩායම්) වශයෙන් පැමිණෙන වෛද්‍යාචාරීන්ගෙන් හා ප්‍රතිකාර කොට සුවකිරීමට නොහැකිව ආපසු යන වෛද්‍යවරුන්ගෙන්/ ප්‍රතිකාර කිරීමට පැමිණෙන වෛද්‍යවරුන් ගෙන් හා ප්‍රතිකාර කොට සුව කිරීමට නොහැකිව යන වෛද්‍යවරුන්ගෙන්
III. තෙල් කාලක් ආලේප කළාක් මෙන් මුළු සිරුරේම ධමනි පෙනෙන්නට පටන් ගත්තේ ය.
IV. වියළි ලී දණ්ඩක්/ වියළි දර ලීයක් (ලකුණු 04)

(ඉ)

I. බිරිඳ අත අමු මස් නැවත යැවීම
II. තමා වෙත දිව ආ හස්තියාට විදීමට ඊතලයක් භාවිත කළ නිසා
III. සොර නායකයා හා චුල්ලධනුද්ධර එකිනෙකා හා පොර බදා චුල්ලධනුද්ධර සොර නායකයාව බිම පෙරළා බිමට ඔබා තද කර ගෙන
IV. තුන් ආකාරයකින් මද වැගිරුණු (ලකුණු 04)

(ඊ)

I. ඊළඟ ආත්මභාවයේදී සැඩොල් දියණියකව උපත ලැබීම
II. බොහෝ උමතු වූවන් සේ කාමයෙන් මත් ව සිහිසුන් බවට / සිහිමුළාවට පත්වීම.
III. මුළු ශරීරයෙන් ම විදුලිය සමූහයක් බඳු රැස් දාම නිකුත් වෙයි.
IV. පායා එන සූර්යයා/ උදා හිරු/ උදෑසන සූර්යයා / ළා හිරු / ළපටි සූර්යයා (ලකුණු 04)

(උ)

I. සිතුවමක ඇඳි ඇත්රූප විලසින්
II. අනුප්‍රාසය/ එළිසමය
III. පියාපත් සැලීමක් නොමැතිව මීමැසි සමූහයා රැඳී සිටි කම්මුල් සහිතව
IV. කුතුහලයෙන් යුක්තව (ලකුණු 04)

(ඖ)

I. කුරුණෑගල සාහිත්‍ය යුගයේ රචිත පන්සිය පනස් ජාතක පොතේ චුල්ලධනුද්ධර ජාතකයෙන් උපුටා ගෙන ඇත. පතිව්‍රතා ධර්මයට පටහැනිව ක්‍රියා කළ ස්ත්‍රියට (චුල්ලධනුද්ධරයන්ගේ බිරිඳට) ශක්‍රයා විසින් නින්දා කරන ලද අවස්ථාවේ එම ස්ත්‍රිය ශක්‍රයා අමතා මෙසේ කීවාය.

II. ගම්පොළ අවධියේ දී දෙවන ධර්මකීර්ති හිමියන් විසින් රචනා කරන ලද සද්ධර්මාලංකාරයේ නන්දිවාණිජ වස්තුවෙන් උපුටා ගත් පාඨයකි. ශිව අමාත්‍යයා සමග ගමන් කරමින් සිටින අතර උඩුමාලෙක දෙවඟනක සේ සිටි නන්දිය වෙළෙන්දාගේ බිරිඳ දැක ඇයගේ ස්වාමිපුරුෂයා දැන් සිටින්නේ කොහේ දැයි ඇසූ පැනයට සේවකයන් විසින් දෙන ලද පිළිතුරයි.

III. දඹදෙණි අවධියේ දී බුද්ධපුත්‍ර හිමියන් විසින් රචනා කරන ලද පූජාවලියේ අනුරුද්ධ කුමාර කථාවෙන් උපුටා ගන්නා ලද්දකි. අනුරුද්ධ කුමාරයා ප්‍රමුඛ රාජකුමාරවරුන් බුදුන් කෙරේ මහණ වන්නට යාමට පෙර ඔවුන් පැලඳ සිටි සත්රුවන් ආභරණ ගලවා උතුරු සළුවක පොදි බැඳ උපාලි කපුවාට භාර දුන් අවස්ථාවේ එම රාජකුමාරවරුන් සිදු කළ ප්‍රකාශයකි.

IV. දඹදෙණි අවධියේ දී ධර්මසේන හිමියන් විසින් ලියන ලද සද්ධර්මරත්නාවලියේ කුණ්ඩලකේසී කථා වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. ජම්බු පරිබ්‍රාජිකාව සැවැත්නුවර දොර සමීපයේ සිටුවා ගිය දඹ අත්ත ඇය සිඟා වළඳා පසුව පැමිණෙන විට ගලවා තිබෙනු දැක එය එසේ කළේ කවරෙක්දැයි විචාළ කල්හි තමා විසින් ගලවන ලද බව සැරියුත් මහතෙරුන් පැවසූ විට එසේ නම් තමා හා වාදයටද පැමිණෙන්නැ'යි ජම්බු පරිබ්‍රාජිකාව උන්වහන්සේට පවසන අවස්ථාව හා සම්බන්ධයි.

V. ඇරැව්වල නන්දිමිත්‍ර රචනා කළ 'නංගී' කෙටිකතාවෙන් උපුටා ගත් ප්‍රකාශයකි. දෙමාපියන්ගේ වියෝවෙන් පසු තනිවන දයානී පාසල් නොගොස් බංගලාවක වැඩ කර මුදල් සොයා සිය අයියා වන ජිනසේනගේ ඉගෙනුමට වියදම් කරන බව ප්‍රකාශ කළ අවස්ථාවේ ඊට විරුද්ධ වෙමින් ජිනසේන දයානිට මෙසේ පවසයි.

VI. ඒ. පී. ගුණරත්න විසින් අනුවර්තනය කරන ලද බැද්දේගම කෘතියෙන් උපුටා ගන්නා ලද්දකි. සිලිඳු විසින් ආරච්චිල හා ප්‍රනාන්දු මරා දමන ලද බව රටේ මහත්තයාට පැවසීමට ඔහුගේ නිවසට පැමිණි අවස්ථාවේ රටේ මහත්තයා විසින් සිලිඳු අමතා කරන ලද ප්‍රකාශයකි.

VII. එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචනා කරන ලද 'පෙමතො ජායතී සොකො' නාට්‍යයෙන් උපුටා ගන්නා ලද්දකි. විවාහයෙන් පසු (එක් ව වාසය ආරම්භ කිරීමෙන් පසු) රාජ්‍ය සේවයට හා සිප්හලට නොගිය උද්දාල බමුණා අමතා ස්වර්ණතිලකා එම ස්ථානවලට යන ලෙස පැවසූ අවස්ථාවේ උද්දාල බමුණා ස්වර්ණතිලකාට මෙසේ පවසයි.

(ලකුණු 03×04 = 12)

(එ)

හෙළ හවුලේ ප්‍රකට කවියකු වන අරිසෙන් අහුබුදු සූරින්ගේ මඟුල් ගීය කවි පෙළේ වස්තු විෂය වසන්ත සමය තුළ ජීව අජීව පරිසරයේ සිදුවන ප්‍රබෝධය වර්ණනා කිරීමයි. එනම්, අවුරුදු උදාවත් සමඟ බක් මාසයේ පාරිසරික සෞන්දර්යයන් හා ජන දිවියේ පිබිදීමත් විචිත්‍රත්වයෙන් වර්ණනා කිරීමයි. හාත්පස පරිසරයෙන් දර්ශනය වන විශේෂත්වය කවියා ඉදිරිපත් කරන්නේ සොබාදම් කත ලෝකය විසිතුරුව සරසන්නාක් ලෙස ය.

- භාෂා භාවිතය

'ඇ' කාරය භාවිතය, අමිශ්‍ර සිංහල භාෂා ව්‍යවහාරය, ස්වභාව ධර්මයට ස්ත්‍රීවාචීත්වය ආරෝපණය කිරීම, ධ්වනිතාර්ථවත් භාෂා ව්‍යවහාරය.

- සංකල්ප භාවිතය

මුළු ලොව උයනක් කරවන්නී, ලෝකත විසිතුරු කැරැලන්නී, නෙත ගිය ගිය අත පණවන්නී, ලොවටම මඟුලක් සලසන්නී.

- කාව්‍යෝක්ති භාවිතය

මල්ගොමු ගුමු ගුමු ගන්වන්නී, ජම්බු ගහට රත පොරවන්නී, දස දෙස සුවඳින් බැඳැලන්නී,
සිසිර කුමරි පස්සට ලන්නී.

- ගීතවත්බව

'නී' යන්නෙන් සියලු කාව්‍ය පද අවසන් කිරීම නිසා සමස්ත කාව්‍ය නිර්මාණයේම බසෙහි ගීතවත් බව රැකී ඇත.

- හෙළ හවුලේ භාෂා ව්‍යවහාරයට ආවේණික 'ඇ' කාරය භාවිතය

කැරැලන්නී, මී වදවලැ, බැඳැලන්නී, නෙතැනැ, ලොවට මැ, ගමේ මැ.

- රූපක භාවිතය

ලෝකත, සිසිරකුමරි, ගිම්කුමරිට, දිනිසුරුකුමරුට.

(ලකුණු 12)

2.

මට්ටකුණ්ඩලීට ආභරණ තැනීමට බඩාල් කෙනෙකුන් ගෙන්වා නොගෙන කුණ්ඩලාබරණ තැනීම, (ධනය වියදම් වේ යන චිත්තාභ්‍යන්තර ගැටීම)

"ආභරණ කරවන්ට බඩාල් කෙනෙකුන් ගෙනාවොත් කර්මාන්ත කරවන තෙක් දවස උන්ට බතුත් දිය යුතු ය. එසේ කලට නැතක් වී සාල් වියදම් වෙයි. නැවත කර්මාන්තය නිමවා දුන් කල මිලත් දිය යුතු ය. එසේ කලට ආභරණයෙන් හා කළ මිලයෙන් කැටි ව බොහෝ වස්තුත් වියදම් වෙයි. බොහෝ සිතිවිලි සිතා තුමූ ම රත්රන් හැරගෙන, අකුරු ලියන සේ නොදන්නා කෙනෙකුන් පත්වල හිරි අඳිනා සේ..

- දරුවා රෝගී වූ අවස්ථාවේ බැමිණිය විසින් බමුණාට දරුවාට ප්‍රතිකාර කරන ලෙස සිහිපත් කිරීම, එහිදී ධනය වියදම් නොවන ලෙස පිළියම් කිරීමට ක්‍රියා කිරීම. (දෙදෙනා අතර සංවාදය
- " තොපගේ පුතණුවන්ගේ සැටි පෙවෙත් නපුර. උන් තමන් නොකියතත් ලෙඩක් දුකක් ඇත්තා සේ ය. ඊට නිසි පිළියම් දන්නා කෙනෙකුන් ගෙනවුත් පිළියමක් කරව"යි උන්ගේ අදහස් ආභරණය කළ ලෙසින්ම නොහැඟුණා සේ කිවූ ය. බමුණාණෝ ඒ අසා "පින්වත් බැමිණී කුමක් කියයි ද? පිළියමට වෙදවරුන් ගෙනා කල වෙදකම් නිමන තෙක් බතුත් දුන මැනව. මං කුලීත් දුන මැනව. කෙළවර මිලත් දුන මැනව. බලවත් ව තිබෙන ව්‍යාධි හෙයින් මිලත් මදෙකින් සෑහී නො යෙයි. හීදඬු මිටියකින් එක් හීදණ්ඩක් හයාගත් කලට අඩුව පෙනෙන්නා සේ කවර තරම් වස්තුයෙකත් දවසක් වුවත් ප්‍රයෝජන වුන් කලට අගය අඩු වන්නා සේ..
- අසාධ්‍ය දරුවා ඇතුළු ගෙයින් පිට කිරීම, (මෙතෙක් වස්තුව තබාගෙන තම පුතු මරා ගත්තා යැයි අපවාද විඳීමට ඇති බිය,)

"මූ මළ කල ඉලව්වට ආ කෙනෙක් ඇතුළුගෙයි පුරා තුබූ සම්පත් දැක මෙතෙක් සම්පත් තබාගෙන හිඳ දුප්පතා සේ පුතුට පිළියම් පමණකුත් නො කරවා නසාපී ය. අනේ! මේ මහා ලෝභී එකෙක් වනැ'යි මා ලෝභී කොටත් සිතා ගනිති."

- මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා සහ අදින්නපුබ්බක අතර සංවාදය.

පේන දේ ඉල්ලා අඬන එකාද නොපෙනෙන දේ ඉල්ලා අඬන එකාද මෝඩයා යැයි තීරණය කිරීම (තමාට තමාගේ වරද පෙනෙන්නට ප්‍රමාද වන බව)

"සෙසු සක්වලින් ප්‍රයෝජන නැතැ'යි කිව. බමුණු ඒ අසා ළදරුව, තෝ ඉතා ම නුවණ නැත්තේ ය. පැතුවමනා දෙය තබා පොල් ගසින් තල්පක් පතන්නා සේ තල් ගසින් පොල්පක් පතන්නා සේ ගින්නෙන් සිහිල් පතන්නා සේ අකුසලින් කුසල පතන්නා සේ නොපැතුවමනා දෙය පතයි. තා හඬා මියතත් ඒ දෙක ලබන්ට බැරි ය'යි කිවූය. ඒ අසා මට්ටකුණ්ඩලී දෙව්පුත් 'බමුණාණෙනි, තෙපි මා නුවණ නැතැ'යි කියව. හැඬීමෙන් තොපත් මාත් සරි පසු නුවණ ඇත්තවුන් නැත්තවුන් වේ ද තේරුවමනා ය. යම් කෙනෙක් යමක් දැක ඒ ලබන්ට හඬත් නම් ඌ නුවණ නැත්තෝ ද? නොහොත් නො දක්නා දෙයට හඬන්නෝ නුවණ නැත්තෝ ද? ඒ දෙපක්ෂයෙන් නුවණ නැත්තවුන් තෝරාලා තවත් සිතට නො නැංගොත් හඬව."

- රත්‍රං රිදීවලින් කරත්ත රෝද සාදා දීමට එකඟ වීම, (අහිමි වීම හමුවේ ත්‍යාගී වීම.)

"මම වන්නා දරු ශෝකයෙන් හඬමි. තොපි කුමක් නිසා හඬා දැ'යි, විචාළෝ ය. මට්ටකුණ්ඩලී ඒ අසා මාගේ රථ මැදිරියෙක් ඇත. ඒ තෙමේත් ගනරන්මුවා ය. ඊට නිසි වූ සක්සඟලක් නොලැබෙමි. ලදොත් ජීවත් වන්නාක් මුත් නොලදොත් ජීවිතය හරිමි.. තොප ඉල්ලන සක් සඟළ මාගේ සම්පත් බොහෝ ව ඇති බැවින් රත්රනින් වුවත් රිදියෙන් වුවත් මුතු මැණික් ආදියෙන් වුවත් තොප කියාලූ තරමෙක කරවා දෙමි... සත්රුවනින් සක් සඟළක් කරවා දෙමි."

- මට්ටකුණ්ඩලී දිව්‍යපුත්‍රයකු වූ බව අදින්න පුබ්බකට අදහාගත නොහැකි වීම, කර්මය හා කර්ම ඵලය පිළිබඳ අනවබෝධය.

"යම් කෙනෙකුන් අරහයා තෙපි හඬවූ නම් ඒ තොපගේ මළ පුතුණුවෝ නම් මම ය. ගොසින් දෙව්ලොව උපනමි... තොප මිය වෙන් වන තෙක් අප ගෙන් වෙන් වූවා නැත. ඒදෑතුරේ දනක් පිනක් කරන්නා නුදුටුම්හ. දෙව්ලොව උපන්නේ කුමන පින් කොට ද? තොප දෙව්ලොව උපදනා කල දෙව්ලොව නූපදනවුන් නැති නියා වේදෑ."

අදින්නපුබ්බක බුදුන් කරා ගොසින් බුදුන් කෙරෙහි සිත් පහදවා ගත් සැණින් දෙව්ලොව උපදිනවා දැයි, ඇති වූ සැකය

"මහණ ගොයුමාණෙනි, සරලුවක් පමණ කැඳ වේව යි සැන්දක් පමණ බත් වේව යි. අන් කිසිවක් වේව යි. තොපට වේව යි තොපගේ සව්වන්ට වේව යි දන් නො දී පේත් නො ව බණත් නො අසා හුදක් තොප කෙරෙහි සිත් පහදවා ගත් පමණකින් දෙව්ලොව ඉපිද දිව්‍ය සම්පත් ලබන්නෝ ඇද්දෑ'යි විචාළහ... බමුණ, හඳුනන මහ යමින් සිට මං විචාරන්නා සේ මා අතින් කුමක් නිසා විචාරයි ද? තාගේ පුත් මට්ටකුණ්ඩලියා මා කෙරෙහි සිත් පහදවා එපමණකින් තමා දිව්‍යසම්පත් ලත් නියාව තට කීයේ වේ දෑ'යි"

"භවත් ගෞතමයෙනි, කවර දවසෙක අවුත් කොයි දී මා හා කතා කළේ දෑ'යි විචාළහ.. යම් දවසක තෝ සොහොනේ හඬ හඬා සිටියේ ආභරණලා මල් පැළඳ මට්ටකුණ්ඩලී ලෙසින් සොහොන ළඟට අවුත් හඬ හඬා සිටි එකකු දැක ඔහු අතින් ශෝකාකාරණ විචාළෙයි වේ ද.."

**කුණ්ඩලකේසීගේ වස්තුවෙන්**

- මරන්නට ගෙනයන සොරුට පෙම් බැඳිම, (මව සමග ඇතිවන සංවාදය)

"මරන්ට ගෙනයන තැනැත්තවුන් දැක උන් කෙරෙහි ඇලුම් ඇති නියාවත් උන් ලදොත් මුත් නොලදොත් ජීවත් වීම නියම නැති නියාවත් කී කල්හි' පුතඬ, එසේ සිතන්නේ හැයිද? මුඹ වර්ධනව සිටියවුන් හෙයින් ගෙයි තබාගෙන හිඳුමෝ ද? ජාති ආදීන් සරි සාමාන්‍ය තැනකට පාවාදිය හැක්කැ'යි කිවූ ය. අපට අනික් කවුරුනුත් නො කැමැත්තේ මුන් නො ලද්දොත් මියෙමි.' කිවූ ය."

- කුණ්ඩලකේසී සොරහුගේ සිත් ගැනීමට ක්‍රියා කළ අයුරු,

"සිටුදුවණියෝත් එවක් පටන් ඔහු සිත් ගන්ට සව්භරණ ලා සැරහීගෙන තුමූ ම ඕහට බත් මාළු පිසති, කවති, පොවති, ඉස සෝධවති, නාවති."

සොරු කුමරිය මැරීමට උපායක් සිතීම, ඇඳ මත වකගසා නිදාගෙන සිටි අවස්ථාවේ ඇතිවන සංවාදය

"අපගේ දෙමව්පියන්ගෙන් මුසුප්පුවක් ඇති නියා දෑ'යි විචාරා 'එයිත් නැතැ'යි කී කල්හි 'එසේ කල මුසුප්පු හැයි දෑ'යි කිවූ ය. 'සොඳුර එදවස් මරන්ට ගෙනයන ගමනේ සොරුන් හෙළන ගල වසන දෙවියන්ට යාදිනයක් කොට දිවි ලදිමි. දිවි තබා උන්ගේ ම ආනුභාවයෙන් මාගෙන් කිසිත් වියදමක් නැති ව තොපත් ලදිමි. උන්ට පිදේනියක් දෙන්ට නැති හෙයින් මුසුප්පුයෙමි'. 'එවිතරෙක් වී නම් මුසුප්පු වන්ට නොකැමැත්තේ ය. පිදේනිය පුදමි. වුවමනා කිම් ද?."

- සොරා උපායෙන් නිවසේ සෙසු අය අය සොරපව්වට ඒම වළක්වා කුමරිය පමණක් කැඳවාගෙන යාම.

"සොඳුර මෙතැන් පටන් තොප හා මා යත් මුත් සෙස්සන් ගෙනයන්ට බැරි ය. බොහෝ දෙනා ගෙන ගිය කල කසළත් කෙරෙති. නවතාලියත් නොහැක්ක. දෙන්න පමණෙක් යම්හ. දෙවියන්ට පුදන්ට ගෙන යන දෙය බැවින් පිදේනිය තොපි ම අල්වා ගනුව' යි කිවූ ය."

- සොරපව්ව මුදුනේ දී සොරා කුමරිය සමග ගල් මුදුනට පැමිණි කාරණය හෙළි කිරීම

'බිලියම් කරන්නැ'යි කිවූ ය. බැණ නොනැගෙන්නේ හැයිදෑ.. මට බිලියමින් කම් නැත. බිලියම් පිටලාලා තොප මෙතනට ගෙනෙන පිණිස ය'යි. කී ය. 'ගෙනායේ හැයිදෑ'යි.. "තොප මරාපියා ආභරණ හැරගෙන පලායන්ට ය."

- ජම්බු පරිව්‍රාජිකාව සහ කුඩා දරුවන් අතර සංවාදය,

"සැරියුත් මහ තෙරුන් වහන්සේ සිඟා වළඳලා නුවරින් නික්මෙන සේක් දඹ අත්ත පිරිවරා සිටි සුඟුන් දැක මේ කිම් දැයි විචාළ සේක. කුඩා සුඟු මහ තෙරුන් වහන්සේට එපවත් කීහ. 'ඔබත් එසේ වී නම් දඹ අත්ත මඩුව'යි වදාරා 'බම්හ'යි කී කල්හි වාද කිරීම අපට භාර ය. තොපි මැඩවූවා'යි වදාළ සේක.

දඹ අත්ත ඉදිරීම, එහිදී සැරියුත් හිමි, දරුවන් කුණ්ඩලකේසී අතර ඇතිවන සංවාද

"තොප හා අප කරන වාද නැත. කුමක් නිසා අපගේ දඹ අත්ත මැඩියා දැ'යි කිවූ ය. කුඩා සුඟු 'මහ තෙරුන් වහන්සේගේ බසින් අත්ත මැඩුම්හ. අපි කුමට මිරිකමෝ දැ'යි කිවූ ය. ඔබත් එතැන ම වැඩ සිටි හෙයින් "ස්වාමීනි, මුඹ වහන්සේද මැඩවූ සේක්" යයි විචාළෝ ය... නැගණියනි, අත්ත මැඩවූමෝ එසේ ය අපි ය'යි වදාළ සේක. 'දඹ අත්ත මැඩ වූවා සේම අප හා වාදත් කළ මැනවැ'යි කිවූ ය. 'යහපත වාද කරම්හ'යි වදාළ සේක.

සුදුසු පරිදි අවශ්‍ය නිදසුන් ලබා දී ඇත්නම් ලකුණු ලබාදෙන්න.

**නැතහොත්,**

බොහෝ ජාතක කථාවල ස්ත්‍රිය දෝෂ දර්ශනයට ලක් කරන අවස්ථා බහුල වුව ද පිරිමින්ගේ ආධිපත්‍යධර හැසිරීම් නිසා ස්ත්‍රිය පීඩාවට පත්වන තැන් ද ඒවායෙහි අඩු වැඩි වශයෙන් දක්නට ලැබෙයි. පුරුෂාධිපත්‍යය නිසා ස්ත්‍රිය පීඩාවට පත්වන අවස්ථා නියමිත ජාතක කථාවල අතීත ප්‍රවෘත්ති ආශ්‍රයෙන් නිදර්ශන ඉදිරිපත් කරමින් විමසා තිබීම මෙහි දී අපේක්ෂිත ය.

**චන්ද කින්නර ජාතකය**

- බඹදත් රජු කිඳුරිය කෙරේ ලෝභයෙන් කිඳුරා ඊයකින් විද මරා දැමීමට උත්සාහ කිරීම නිසා කිඳුරිය බලවත් පීඩාවකට පත්වෙයි.

"එසඳ බරණැස් රජ්ජුරුවෝ ඒ ගායනා ශබ්දය අසා පියසන් නො ඇසෙන සේ සෙමෙන් අවුදින් දිය කිඳුරාණන් උන් නියාව ද නටමින් සිටි කිඳුරංගනාවන් දැක පිළිබඳ සිත් ඇතිව මේ කිඳුරා විද දිවි තොර කොට මෑ හා සමඟ වාසය කෙළෙම් නම් යහපතැ'යි සිතා සැඟවී සිට කිඳුරාට හීයක් විද්දේය. "

**චුල්ලධනුද්ධර ජාතකය**

- ධනුද්ධර කුමාරයා වනයේදී මස් ඉල්ලාගෙන ඒම සඳහා කුමරිය සොරමුලක් වෙත තනිව යැවීම.

"... චුල්ලධනුද්ධරයෝ එතනට පැමිණ තමන් බිරිඳට කියන්නාහු දඩමස් පුළුස්සා කන මිනිසුන් උන් වෙතට ගොස් දඩමස් ඉල්වාගෙන එවයි කියා එවූහ"

- ඇය රැගෙන ආ අමු දඩමස් එපා කියා නැවත ඔවුන් වෙත ඇය අතේ ම යැවීම.

"... දෙවෙනිව බිරින්ද අත අමු මාංශ යවන්නා සොරු පන්සියය කෝප වන"

- සොරදෙටුවා කුමරියගේ ආභරණ ඇය ලවා ම ගලවා ඇයගේ ඇඳිවත උණාගෙන එහි පොදියක් කොට බැඳගෙන පලා යාම.

"සොඳුර තොප ඉන තිබූ ඉන කඩින් තොප පලන් ආභරණ ගලවා බැඳ දී ලන්න. එතෙර තබා තොප කැඳවාගෙන යෙමි"

"ස්වාමිනී පුත්‍රයාණෙනි මා ඇර පියා නික්මුණු නියාදැයි කියන්නා තොපගේ පරණ සමණානන්ට කළ දෑ දුටු කල මට තමා ම වේද, තීගෙන් මට ප්‍රයෝජන නැතැයි කියා නික්මුණාහ"

- පුරුෂයන් දෙදෙනෙකු විසින් අසරණ කර දමනු ලැබූ ඇඳිවත ද අහිමි ව වනයෙහි අනාථ ව සිටි කුමරියට ශක්‍රයා ද කැණහිල් වෙසකින් පැමිණ අවමන් කිරීම.

"... තොපගේ පළමු පිසවා කෑ සමණනුත් නැතිව අලුත් සමණනුත් නැතිව උභය භ්‍රෂ්ට ව ඉඳිනා තෙපි මට නින්දා කියා සිනාසෙන්නේ යයි ශක්‍රයෝ නින්දා කොට බිණූහ"

ආදි සුදුසු උදාහරණ සපයමින් සාකච්ඡා කොට ඇති පිළිතුරකට ඉහළ ලකුණක් පිරිනැමිය හැකිය.

(ලකුණු 15)

3.

පූජාවලියේ අනුරුද්ධ කුමාර කථාවේත් ජීවක කථාවේත් එන ඇතැම් චරිත අභියෝග හමුවේ ගනු ලබන නිවැරදි තීරණ නිසා ජීවිතය ලෞකික ලෝකෝත්තර යන කුමන අංශයකින් හෝ සාර්ථකත්වයට පත් කරගන්නා ආකාරය පැහැදිලි වෙයි.

**අනුරුද්ධ කුමාර කථාව**

මහානාම කුමාරයා අනුරුද්ධ කුමාරයාට ගිහි ගෙයි වසන්නේ නම් උපයාගෙන කෑ යුතුබවත් ඒ සඳහා කෘෂිකර්මයෙහි යෙදිය යුතු බවත් එය ඉතා දුෂ්කර කාර්යයක් බවත් පෙන්වා දෙයි. එවිට අනුරුද්ධ කුමාරයා ගිහිගෙයි විසීම අත හැර පැවිදි වීමට තීරණය කරයි.

"මෙසේ වූ දුකක් ඇති ගිහිවාසය මට නොකැමැත්තේය - මට ස්නේහ ඇතියේ නම් නුඹ මහණ වන්නට නොගොස් මා ම පළමු කොට බුදුන් කරා යවාපුව මැනවැ"

පැවිදිවීම සඳහා මවගේ කැමැත්ත ලබා ගැනීමේ අභියෝගය

- "මාගේ මෑණියන් වහන්සේ රජ්ජුරුවෝ නම් මහණ වන්නට නොයෙහි උන් කරා යැවූ කල ඔහු මුන් රඳවා ගනිති'යි මායමින් සමු දුන් සේක. රජ්ජුරුවන් මහණ නොවෙන්නේ සැබැව. මම උපදෙසකින් උනුත් එක් කොට ගෙන මහණ වෙමි ම ය. "
- මහණ වීමට යාම සඳහා භද්දිය රජු එකඟ කරවා ගැනීම.
- ශාක්‍ය කුමාරවරුන් සදෙනා තමන්ට පළමුව උපාලි නම් කපුවා පැවිදි කරන්ට යැයි බුදුරදුන්ගෙන් ඉල්ලීම.

"මේ අපගේ උපාලි නම් කපුවාණන් පළමුව මහණ කොට අප පසුව මහණ කොට වදාළ මැනව ... එසේ කල අපගේ අභිමානත් සිදෙයි. මහණ දම් මුදුන් පැමිණෙයි. "

**ජීවක කථා වස්තුව**

- ජීවක තමන්ට මවක් පියෙක් හෝ කුල පරම්පරාවක් හෝ නොමැතිබව දැනගත්විට ශිල්පයක් ඉගෙනීමට තීරණය කිරීම.

"මාගේ කිසි නෑසිය කෙනෙකුත් නැත.මතු මට හිමිවන කුල සැපතෙකුදු නැත. එසේ හෙයින් මා විසින් ශිල්පයක් හදාරා ගත මැනව. "

- තමා වැනි අයෙකුට වෛද්‍ය ශිල්පය හැදෑරීම ප්‍රයෝජනවත් යැයි තීරණය කිරීම.

"වෛද්‍ය ශිල්පය හදාරා ගතිම් නම් වෛද්‍යාචාර්ය යන නම ඇසූ කල ම සත්ත්වයෝ මවුන් පියන් ගුරුන් කොට සිතා ඔවුන් කෙරෙහි ප්‍රිය ඇති වන්නාහු ය. වෛද්‍ය ශාස්ත්‍රය නම් දතුවාහට මෙලොවත් වැඩ වෙයි. පරලොවත් වැඩ වෙයි. පින් වෙයි"

- දිසාපාමොක් ආචාරීන් වෙත ශිල්ප ඉගෙනීමට ගිය අවස්ථාවේ තමා ගැන කරන හැඳින්වීමක් ආචාරි භාගය ගෙන ආවේදැයි විමසූ අවස්ථාවේ ඊට ලබා දෙන පිළිතුරත් ජීවක අභියෝග හමුවේ නිවැරදි තීරණ ගන්නා තැනකි.

"අනිකක් කීම් නම් මා කෙරෙහි ආදර නොකරති" යි රජගහ නුවර බිම්බිසාර රජ්ජුරුවන්ගේ මුනුපුරානෙමි. අභය නම් රාජකුමාරයන් පුතණු වෙමි" යි කීය.

"දෙමව්පියන්ට නොකියා ශිල්ප ලෝභයෙන් සොරා අයිමි. එසේ හෙයින් ආචාරිභාගය නො ගෙනායෙමි"

- සාකේත නුවර සිටුදේවියගේ ශීර්ෂාබාධය සුව කිරීමට ගොස් පළමුව ප්‍රතික්ෂේප කළ විට පසු නොබැස කෙසේ හෝ තම දක්ෂතාව පෙන්වීමට කටයුතු කිරීම.

"මා දත් ශාස්ත්‍රය මුත් මාගේ වයසින් තමන් වහන්සේට ප්‍රයෝජන කිම් ද?  තෙල රුජාව සන්හිඳුවා මිස නොයෙමි"

- බිම්බිසාර රජු ජීවකගේ තරම පරීක්ෂා කිරීමට බිසවුන්ගේ පලඳනා ගලවා ඔහු ඉදිරියේ ගොඩ ගසා ඒවා ගන්නැයි පවසන අවස්ථාවේ ක්‍රියා කරන අන්දම.

“දේවයන් වහන්ස මේ සැපතින් මට කම් නැත. බිසෝවරුන් වහන්සේ අත කර ලූ පලඳනා මා වැන්නන්ට සුදුසු නොවෙයි”

- චණ්ඩපජ්ජෝත රජුට ප්‍රතිකාර කොට දිවි ගලවා ගෙන රජගහ නුවරට පෙරළා පැමිණීම.

“... එකලාව ම රජගහ නුවරට ගොස් රජ්ජුරුවන් දැක තමන් පිළියම් කළ පරිදිත් ගැළවුණු උපදෙසුත් රජ්ජුරුවන්ට කීය”

මේ ආදි සුදුසු අවස්ථා ආශ්‍රයෙන් පිළිතුර සාකච්ඡා කොට තිබිය යුතු ය.

නැතහොත්

සද්ධර්මාලංකාරයේ ස්වර්ණතිලකා වස්තුවේ හා නන්දිවාණිජ වස්තුවේ එන චරිත මඟින් පුද්ගල හැසිරීම්වල යථා ස්වභාවය මැනවින් නිරූපණය කිරීමටත් ඒ ඔස්සේ කථා රසය උද්දීපනය කිරීමටත් රචකයා සමත්ව ඇති අන්දම උදාහරණ ගෙනහැර පාමින් විස්තර කොට තිබිය යුතු ය.

**ස්වර්ණතිලකා කතා වස්තුව**

- මවගේ බැණ වැදීම් හමුවේ දියණිය කෝපයට පත්වීම.

“ඒ නිසා කුමාරිකාවෝ මෑණියන්ට කිපී චණ්ඩාල කෙලී නම් තෙපිම යැ’ යි කියා තමන් මෑණියන්ට බිණූහ”

- ස්වර්ණතිලකාගෙන් අවමන් විඳි සැඩොල් තරුණයා ඒ පිළිබඳව රජුට පැමිණිලි කොට ඇයගෙන් පලි ගැනීමට කටයුතු කිරීම.

“මේ උත්තර මධුරා නම් නුවර ස්වර්ණතිලකා නම් වූ එක් සැඩොල් දුවක් ඇත. ඕ තොමෝ තමා හා සමාන ජාති ඇති පුරුෂයන් විසින් එවන ලද පඬුරු නො ගන්නී ය. වංශවතුන්ම ප්‍රාර්ථනා කෙරෙයි”

- ස්වර්ණතිලකාගේ රූපශ්‍රීය දැක කාමයෙන් මුසපත් වන රජවරුන් පස් දෙනෙකු ඇයගේ කුලහීනභාවය නිසා සමාජ අවමානයට බියෙන් අන්තඃපුරයට වැද්දගත නොහැකිව සියදිවි නසා ගැනීම.
- ස්වර්ණතිලකාගේ මායමින් උද්දාල බමුණා බලවත් සේ කාමාසක්ත වීම.

“... කාමයෙන් උමතුව මහත් වූ ශෝකයෙන් දහගත් ශරීර ඇතිව”

- ස්වර්ණතිලකා කැඳවා ගෙන ආ තැන් පටන් උද්දාල බමුණා සිප්හලටත් රජකාරියටත් නොගොස් ඈ කෙරේම රැඳී සිටීම.

“ඉක්බිති ඒ බ්‍රාහ්මණයා ස්වර්ණතිලකා ගෙට ආ දවස් පටන් සාරමසක් මුළුල්ලෙහි රාජ සේවයටත් නොගියේ ය.”

**නන්දිවාණිජ කතා වස්තුව**

- නන්දිය වෙළඳ භාර්යාව දුටුවිට ... අමාත්‍යයා කාමයෙන් මුසපත් වීම.

“.... තද හීයකින් විත් කෑ මුවකු සේ වෙළඳ භාර්යාවන්ගේ මඳලස බැලුම් නැමැති ශරප්‍රහාරයෙන් මූර්ඡාව... ”

- වෙළඳ භාර්යාව කෙරෙහි අධික රාගයෙන් ඇයව අත්පත් කර ගැනීමට ශිව අමාත්‍යයා දිගින් දිගටම උත්සාහ ගැනීම හා ඇයට බල කිරීම.

“... කෙල්ලක කැඳවා කිසිකෙනෙකුන් නොදන්නා ලෙස රහසින් රන් දහසක් දී ඒ දාසිය වෙළඳාණන්ගේ භාර්යාවන් සමීපයට නික්ම විය”

- වෙළඳ භාර්යාව ශිව අමාත්‍යයාගේ සේවිකාවට යම් දිනක තම ස්වාමියා ජීවතුන් අතර නැති දවසක් වූවොත් එදාට දැනුම් දෙන්නැයි කියා යැවූ විට එය අල්ලාගෙන නන්දිය වෙළෙන්දා මරවා හෝ ඇය ලබා ගනිමියි කාමයෙන් දැස් අන්ධව සිටි ශිව අමාත්‍යයා තීරණය කොට යකැදුරෙකුගෙන් ඒ සඳහා උපකාර ලබා ගැනීම.

ආදි සුදුසු අවස්ථා උදාහරණයෙන් ඉදිරිපත් කරමින් පිළිතුර ලියා තිබිය යුතු ය.

(ලකුණු 15)

4.

(අ) සිංහල සාහිත්‍ය යුග අතර කෝට්ටේ යුගය යනු නවාංග එක් වූ යුගයකි.

කෝට්ටේ යුගය හැඳින්වීම

- දේශපාලන පසුබිම: VI වන පරාක්‍රමබාහු රජු රට එක්සේසත් කිරීම
- ආගමික හා ශාස්ත්‍රීය ප්‍රබෝධය, තොටගමුවේ ශ්‍රී රාහුල හිමි වැනි වියතුන් බිහිවීම සහ පද්මාවතී, විජයබා ආදි පිරිවෙන් අධ්‍යාපනය දියුණුව පැවතීම.

මෙම අවධියේ මෙතෙක් කල් පැවැති ආගමික රාමුවකට සීමා වී තිබුණ සාහිත්‍යය පොදු ජන ජීවිතයට සමීප විය.

සාහිත්‍යයට එක් වූ නවාංග

- සන්දේශ කාව්‍ය සැලළිහිණි, කෝකිල, ගිරා, හංස, පරෙවි සන්දේශ.
- ප්‍රශස්ති සහ විරුද කාව්‍ය, රජුන් ඇමතියන් හෝ වීරයන් වර්ණනා කරමින් ලියැවී ඇත. - පැරකුම්බා සිරිත
- උපදේශාත්මක කාව්‍ය - ලෝවැඩ සඟරාව
- මහා කාව්‍ය බිහිවීම - කාව්‍යශේඛරය
- ජාතකකතා කාව්‍ය - ගුත්තිල කාව්‍යය

කෝට්ටේ යුගය යනු අනුකරණයෙන් මිදී ස්වාධීන අනන්‍යතාවක් ගොඩනැඟූ යුගයකි. එතෙක් පැවති වියත්, ආගමික රාමුව බිඳ දමා සාහිත්‍යය පොදු ජනයාට සමීප කිරීමට කෝට්ටේ යුගයේ නවාංග සමත් විය.

(ආ) වැත්තෑවේ හිමියන් ගුත්තිල කාව්‍යයේ උදේනිපුර සැණකෙළි වැනුම

නගරයේ අසිරිය

- වීදි සැරසිලි වශයෙන් තොරණ, ධජ පතාක සහ මල් මාලාවලින් මුළු නගරයම බැබළුණු ආකාරය

ජන සමාජය

- ස්ත්‍රී, පුරුෂ භේදයකින් තොරව මුළු මහත් සමාජයම වීදි බැස සිටි ආකාරය
- විවිධ ගායන වාදනවලින් සමාජය පිනවූ ආකාරය
- සැණකෙළිය නැරඹීමට දැක්වූ දැඩි උනන්දුව සහ ප්‍රීති ඝෝෂාව

චමත්කාරය

සැණකෙළියේ නළඟනන්ගේ සහ බලන්නට පැමිණි ළඳුන්ගේ රූප ශෝභාව

- කාන්තාවන්ගේ ඇස් චලනය වන ආකාරය
- හැඟීම් ප්‍රකාශනය

වැත්තෑවේ හිමියන් උදේනිපුර සැණකෙළිය වර්ණනාවක් ලෙස පමණක් නොව පාඨකයාට සජීවී දර්ශනයක් ලෙස මවා පෑමට සමත් වී තිබේ.

5. ලෙනාර්ඩ් වුල්ෆ්ගේ The Village in the Jungle කෘතියේ ඒ. පී. ගුණරත්නගේ සිංහලානුවාදය වන බැද්දේගම නවකතාවේ නිරූපිත ගැමි සමාජය මුහුණ දෙන අනේක විධ ව්‍යසනයන් සඳහා හේතු වන කරුණු අතරින් එම ගැමියන්ගේ නූගත්කම ප්‍රධාන වෙයි. ණයතුරුස්වලට පැටලීම, මිථ්‍යා විශ්වාසයන්හි එල්බ ගැනීම, රෝගාබාධවලට ලක්වීම රණ්ඩු සරුවල් කිරීම, සාහසික ක්‍රියාවලට පෙළඹීම. බටහිර වෙදකම ප්‍රතික්ෂේප කිරීම, නඩුහබවලට පැටලීම ආදි දේ සඳහා මේ ගැමියන්ගේ නූගත්කම හේතු වන බව සුදුසු නිදසුන් මඟින් පෙන්වා දීම පිළිතුරෙන් අපේක්ෂා කෙරෙයි.

- බැද්දේගම වැසියන් කිසිවෙකුට අකුරු ලිවීමට කියවීමට හැකියාවක් නොතිබීම ගම්මුලාදෑනියා වූ බබෙහාමි ආරච්චිල පවා දැනගෙන හිටියේ තම නම ලියාගැනීමට පමණ ය. එයින් මේ ගම වැසියන්ගේ නූගත්කමේ තරම පැහැදිලි ය.

"බබෙහාමි ගමේ ප්‍රධානියා නැත්නම් මුලාදෑනියා වූයේ ගමේ සිටියවුන් අතරෙන් නම ලියන්නට හැකි වූ එකම මිනිසා ඔහු වූ හෙයිනි"

- කඹුරුපිටියේ වෙළෙන්දෙකුගෙන් ණයට බඩු ගන්නා විට ඔවුන් ඒවා ණය පොත්වල සටහන් කර තබා ගනියි. එහිදී වෙළෙන්දන් කියන ගණන් හිලව් සත්‍යමදැයි නූගත් ගැමියෝ නොදනිති.

"නොපැහැදිලි අකුරු හා ඉලක්කම් පිරුණ අපිරිසිදු නෝට් පොතුත් රැගෙන ණයකරුවන් කෙලින්ම හේන්වලට ඇදෙන්නේ එකලැය. පැය ගණනක් බැණදොඩා කලකෝලාහල කර පසුව ගනුදෙනු බේරාගන්නා අමුත්තෝ... "

- දියණියන් වැදූ නිසා සිය බිරිඳට සිලිඳු වැදූම්ගෙයි දීම පහර දීම.

"ඩිංගාහාමිට ලැබුණේ ගැහැනු දරු දෙදෙනෙකැයි එහි සිටි ගැහැනුන් සිලිඳුට දැනුම් දුන් විට ඔහු පැල තුළට වැද පැදුරේ වැතිර සිටි මවගේ හිසටත් පපුවටත් පහර දෙන්නට විය. පරවට්ටි කෝ මට පුතෙක් "

- දිය ගෙන ඒමට කර්ලිනාහාමි වැවට ගිය විට එහි සිටි ගැහැනුන් ඇය හා රණ්ඩු කිරීම .

"උඹ ගිහින් අයියත් එක්ක මකබැවෙයන් අර පිස්සා වැද්දා කටවහ කාරයා අනුන්ගේ ළමයි වඳ කරන කුණු බොකු බඩවැල් කන ගැත්තර අම්මණ්ඩි"

- පුංචිරාල වෙදරාලගේ යන්ත්‍ර මන්ත්‍ර බලය පිළිබඳ දැඩිව විශ්වාස කිරීම නිසා සිලිඳු රෝගාතුර වීම නිසා කර්ලිනා හාමි වෙදරාල සොයාගෙන ගොස් අයියා සුවකර දෙන ලෙස ඉල්ලීම. ඔහුගේ උපදෙස් පිට බෙරගම දේවාලයට සිලිඳු රැගෙන යාම හා එහිදී පුංචිරාල විසින් මෙහෙය වනු ලැබූ බොරු සන්‍යාසියකුගේ උපදෙස් අනුව හින්නිහාමි පුංචිරාලට භාර දී යක්ෂයාගෙන් සිලිඳු ගැලවීම යනාදිය නූගත්කම නිසා අත්විඳින දේ ය.

"වෙද මහත්තයෝ මං කුරක්කන් ටිකකුත් අරගෙන ආවේ උඹට. මෙච්චරයි මට ගේන්ඩ තියෙන්නේ. ... මේ ජීවම අහක්කරපන් වෙද මහත්තයෝ; අනේ වෙදමහත්තයෝ මේ ජීවම අහක්කරලා දාපන්"

"නුග ගහක යකෙක් ඉන්නවා. ඒ යකා මෙයාට දිෂ්ටි දමාගෙන ජීවිතේ ටික ටික උරා බොනවා"

- බටහිර වෙදකම පිළිනොගැනීම

"ඔය කඹුරුපිටියේ ආණ්ඩුවෙ ඉස්පිරිතාලෙ තියෙන්නෙ. එතන ඉන්නෙ කලිසම් ඇඳපු අඩි ගහන මහත්තයෙක්. එයා බොහොම හපන්. ආණ්ඩුවෙ බේත් හම්බ වෙන්නෙ නිකම්... "

"අයියෝ! ඉස්පිරිතාලෙ ගිහින් මොකක්ද ඇති වැඩේ ... උඹ මට හිනා වෙනවා"

- පුංචිරාලගේ හා ආරච්චිලගේ උසිගැන්වීමෙන් නූගත් ගැමියන් හින්නිහාමි හා මුව පැටියා මරා දැමීම.

"එදා රෑ ඇ වැදූ පුතා නොවෙයි මුවා? යක්සණියො වදන්නෙ නැද්ද? යක්ස පැටව් ... ඌ උපන්නායින් පස්සෙ මේ ගමට හොඳක් වුනාද... "

"වෙදරාල දුන් අදහස් ගම්මු විශ්වාස කරන්ට වූහ. හින්නිහාමි එන විට කුඩා ළමයි මඟහැර සැඟවූහ. ඇත්තෙන්ම මුවා යක්ෂයෙකි .... රාත්‍රියෙහි අලුත් මිනී වළවල් හාරා මිනී කන බවක් සමහරු කීහ... "

- බබෙහාමි හා ප්‍රනාන්දු එක්ව කළ කුමන්ත්‍රණයෙන් බබුන් අත්අඩංගුවට ගෙන නඩුව විභාග කළ අවස්ථාවේ තම නිර්දෝෂීභාවය පිළිබඳ කීමට තරම්වත් දැනුමක් ඔහුට නොතිබූ නිසා ඔහු නිස්කාරණේ සිරගත වීම.

"වගන්තියෙන් වගන්තිය තේරුම් කර දුන් නඩු තීන්දුවෙන් වචනයක්වත් බබුන්ට තේරුම් ගත නොහැකි විය"

"ඔහු කෑ ගාන්ට වන. හාමුදුරුවනේ මා මේක කළේ නෑ. මට හිර ගෙට යන්ට බෑ හාමුදුරුවනේ."

- සිලිඳු බබෙහාමි හා ප්‍රනාන්දු ඝාතනය කොට ජීවිතාන්තය තෙක් සිර දඬුවම් ලැබීම.

"හාමුදුරුවනේ, මං ආරච්චිරාලයි මුදලාලියි මැරුවා"

ආදි අවස්ථා තුනක්වත් නිදසුන් ලෙස දක්වමින් ලියා ඇති පිළිතුරකට ඉහළ ලකුණක් ලබා දිය හැකිය.

(ලකුණු 15)

**6.**

ජීවිතය හා පොර බදන අනේකවිධ පීඩාවලට නතු වූ මිනිස් චරිතවල ගති සොබා නූතන කෙටිකතාවල මනාව රූපණය කර ඇත්තේ ය.

- නොයෙක් පීඩාවලට පත් වෙමින් ජීවන සටනට මුහුණ දෙන චරිත රැසක් නිර්දිෂ්ට කෙටිකතා සංග්‍රහය ඇසුරෙන් හඳුනාගත හැකිය.
- පීඩිත ගැමි සමාජයෙහි අනේක විධ පීඩාවලට ලක්වෙමින් වහල්බව ද දරාගෙන කටයුතු කරන පවුල් සංස්ථාවක සබඳතා ජාලය වහල්ලු කෙටිකතාවෙහි නිරූපිතය.
- රෝගවලට නතුවීම නිසා පීඩාවට පත්වන කුටුම්බයක් හා සබැඳි සිදුවීම් රැසක් දිසොන්විනාහාමි කෙටිකතාවෙහි නිරූපිතය.
- වකුගඩු රෝග පීඩාවේ බිහිසුණු බව මෙන් ම ඒ හා සබැඳි සහෝදර ප්‍රේමයේ මහිමය ද නංගී කෙටිකතාවෙහි නිරූපිත ය.
- උසස් පාසලක අකුරු කිරීමේ සිහිනය බිඳ දමා ළමා මෙහෙකාර සේවයෙන් පීඩාවට පත්වන චරිතයක් හා සබැඳි සිදුවීම් අකුරට යන වෙලාවේ කෙටිකතාවේ නිරූපිත ය.
- පොල් කැඩීමෙහි නිරත වන නිර්ධන පාන්තිකයෙකුගේ පීඩාකාරී දිවි පෙවෙත හැත්තෑ ලක්ෂයෙන් එකෙක් කෙටිකතාවෙහි නිරූපිත ය.

ඉහත දක්වා ඇති කෙටිකතාවල උදාහරණ ද වෙනත් යෝග්‍ය කෙටිකතාවල උදාහරණ ද ඇසුරෙන් පිළිතුරු සැපයීම යෝග්‍ය වේ.

(ලකුණු 15)

7. මිනිසාට අත්විඳීමට සිදුවන විවිධාකාර දුක්ඛදායක සංසිද්ධීන් නූතන කවීහු ස්වකීය කාව්‍ය නිර්මාණ සඳහා විෂය කර ගනිති. එහෙත් ඒවා වාර්තා ස්වරූපයෙන් නොව කාව්‍යාත්මක ප්‍රකාශනයක් ලෙස ඉදිරිපත් කිරීමට ඔවුහු සමත් වෙති. එහිදී භාවාතිශය නොවී මනා සංයමයක පිහිටා අත්දැකීම් ප්‍රතිනිර්මාණය කරති. කාව්‍ය නිර්මාණයක දී ආරක්ෂා කළ යුතු සෞන්දර්ය සීමාවන් නො ඉක්මවමින් රසිකයන්ගේ සියුම් භාවයන් ස්පර්ෂ කිරීමට ද ඔවුහු උත්සාහ කරති. නිදහස් කවියේ ද්විතීය තරංගය නියෝජනය කරන පහත සඳහන් කවීන්ගේ නිර්මාණ මේ සඳහා නිදසුන් ලෙස ඉදිරිපත් කළ හැකිය.

- දයාසේන ගුණසිංහගේ ‘රන් තැටියක කඳුළු’ කාව්‍ය නිර්මාණයෙන් උපතේ දී ම මිය ගිය බිලිඳියකගේ වියෝගයෙන් කම්පිත පියකුගේ හැඟීම් නිරූපණය කෙරෙයි.
- විදෙස්ගත ලාංකිකයෙකුගේ හුදෙකලාව හා අසහනකාරී මානසිකත්වය විමල් දිසානායකගේ ‘නාගලකන්ද’ කාව්‍ය නිර්මාණයට වස්තු වෙයි.
- බිඳුණු ප්‍රේමයේ වේදනාකාරී මතකයන්ගෙන් මිදී ජීවිතය ජයගැනීමට වෙර දරන අයකුගේ හැඟීම් පරාක්‍රම කොඩිතුවක්කුගේ ‘දේදුන්න පායාවී හෙටත් පාලම උඩින්’ කවි පෙළෙන් ඉදිරිපත් කෙරෙයි.
- දිළිඳු දුක්ඛිත පවුල් පසුබිම විසින් නගරයේ මැදුරක මෙහෙකාර සේවයට ඇද දමනු ලැබූ දැරියකට අත්විඳීමට සිදුවන කායික හා මානසික පීඩා සමුදාය මනා සංයමයකින් යුතු ව මොනිකා රුවන් පතිරණගේ ‘පොඩිදුව’ පද්‍ය පන්තියෙන් ඉදිරිපත් කෙරෙයි.

මේ ආදි සුදුසු කාව්‍ය නිර්මාණ ඇසුරින් කරුණු සාකච්ඡා කොට තිබිය යුතුය.

(ලකුණු 15)

8. “පෙමතො ජායතී සොකො” නාට්‍යයේ පාත්‍රයන්ට විනාශයට මුහුණ දීමට සිදුවන්නේ ඔවුන් තුළ වූ ආත්මාර්ථකාමී හැඟීම් නිසා ය.

- ස්වර්ණතිලකා හා ඇයගේ පියා මහ වැරදී උද්දාල බමුණාගේ සිප්හල හරහා ගමන් කිරීමට පැමිණි විට සිසුන් ඔවුන් එළවා දමන්නට උත්සාහ ගන්නේ දැඩි ආත්මාර්ථකාමී හැඟීමෙනි.

“මෙතනට එන්නට අප ඇඳුරිඳු සඳ - නැත කිසි කෙනෙකුට අවසර දීලා - සිසුනට වෙන් වූ අප වාසය - මේ එකලා පෙදෙසකි - ක්ෂේම භූමියකි”.

- ස්ත්‍රියක දුටුවිට කාලකණ්ණියක දිටිමියි කිරි පැනින් මුව දෙවූ උද්දාල ස්වර්ණතිලකා දැක ඇය කෙරෙහි අනුරක්ත වීම නිසා ඒ පිළිවෙත නොතකා සිසුන් විසින් සිප්හල පෙදෙසින්

ස්වර්ණතිලකා හා ඇයගේ පියා එලවා දමන්නට සැරසෙන විට අමුතු කරුණාවකින් ඔවුන් වළකාලයි.

"මා ඉගැන්වූ සීලය ද ඔබ - පිළිපදින්නේ සිසුනි මේ ලෙස - ගෙට පැමිණෙන අමුත්තාට - මෙසේ ද ඔබ සලකන්නේ?"

- උද්දාල ස්වර්ණතිලකාගේ පියාට පංචමධුරාපුර රාජ මැඳුරේ ගඳඹ තනතුරක් ලබා දෙන්නේ ස්වර්ණතිලකා කෙරෙහි වූ ආත්මාර්ථකාමී චේතනාවෙනි.
- මිතුරන් විසින් උද්දාල බමුණාට සැඩොල් යුවතියක වන ස්වර්ණතිලකා නොගැළපෙන බව පවසන ලද අවස්ථාවේ ඔහු

"මැණික නම් මැණික වේ - කිලුටු පස්යට තිබී ලැබුණ මුත් - මැණික නම් මැණික වේ" යනුවෙන් කියමින් තර්ක කරනුයේ ද ආත්මාර්ථකාමීත්වය නිසා ය.

- ස්වර්ණතිලකා උද්දාල බමුණා හා විවාහ වීමෙන් පසුව කරන මේ ප්‍රකාශය තුළ ගැබ්ව ඇත්තේ ද ඇය තුළ වූ ආත්මාර්ථයයි.

"සමීපේ ඔබතුමා වැනි වූ - පවර ගුණ යුත් කෙනෙකුගේ හිඳ - දවස් හරිනට මිඩි මෙහෙන් හෝ - ලැබී ඇති වාසනා මහිමය - සිහිනෙකින් දෝ විඳින්නේ මා"

- උද්දාල බමුණා හාර මසක් ගතවනතුරුත් සිප්හලට හෝ රාජ සේවයට නොයා ස්වර්ණතිලකා අසල ම ගැවසී සිටීමෙන් ප්‍රකට වන්නේ ද ඔහු තුළ වූ දැඩි ආත්මාර්ථකාමීත්වයයි.

"මා යවන්ට කැමතිද ඔබ - නිරතුරු ඇවිටිලි කරන්නේ - අරුචි වී ද මා ඔබ හට"

- උද්දාල බමුණා දිගින් දිගට ම සිප්හලට නො පැමිණීම නිසා සිසුන් නොසන්සුන් වන්නේ ද ආත්මාර්ථකාමීත්වය මත ය.

" .. ඇදුරුතුම අප නොසලකන්නට - කිම් ද කාරණ නොවැටහෙන්නේ - සැඩොල් දුව හා සරණ වූ පසු - සරි ද දැන් අප අත්හරින්නට"

- අවසානයේ ඔවුන් එක්ව ස්වර්ණතිලකා මරා දමන්නේ එය සැළ වූ විට සොවින් මුසපත් වන උද්දාල ඇය දවන සෑයට ම පැන දිවි දෙන්නේත් ආත්මාර්ථය සියලු විනාශයන්ට මුල් වන බව පසක් කර දෙමිනි.

මේ ආදි සුදුසු උදාහරණ සපයමින් පිළිතුර ලියා තිබිය යුතු ය.

(ලකුණු 15)

# II පත්‍රය

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව -2026
71 - සිංහල

ආදර්ශ උත්තර හා ලකුණු දීමේ පටිපාටිය

Ⅱ පත්‍රය

විසඳුම් පත

1.

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 1.1 | (2) | 1.11 | (5) |
| 1.2 | (5) | 1.12 | (2) |
| 1.3 | (4) | 1.13 | (4) |
| 1.4 | (1) | 1.14 | (5) |
| 1.5 | (3) | 1.15 | (1) |
| 1.6 | (2) | 1.16 | (3) |
| 1.7 | (5) | 1.17 | (2) |
| 1.8 | (4) | 1.18 | (1) |
| 1.9 | (3) | 1.19 | (5) |
| 1.10 | (1) | 1.20 | (3) |

(ලකුණු 01×20 = 20යි)

2. (අ).

I. නව දාර්ශනික මතවාද හා ඥාන ගවේෂණය පිළිබඳ දාර්ශනිකයන්ගේ චින්තනය යුරෝපය තුළ පැතිර යාම

II.
1. කතා ව්‍යවහාරයට වඩා ලේඛනයට ප්‍රමුඛස්ථානයක් දීම.
2. නිර්දේශාත්මක උපදේශාත්මක ව්‍යාකරණ සිද්ධාන්ත ගුරු තන්හි තැබීම.
3. භාෂාවක සංස්ථිතික ලක්ෂණ දාර්ශනික පදනමක් මත විමසීමට ලක් කිරීම.
4. සැම භාෂාවක් ම ලැටින් භාෂාවේ ව්‍යාකරණ ආදර්ශයෙන් විමසා දැක්වීම.

(මෙයින් දෙකක් ලියා තිබීම අවශ්‍ය වේ.)

III. යුරෝපීය භාෂා අතර පැවැති ඥාති සම්බන්ධය පවා විවරණය කිරීමට අවධානය යොමු නොවීම.

IV. දහ අටවන සියවසේ දී සංස්කෘත භාෂාව හා ව්‍යාකරණය පිළිබඳ දැනුම යුරෝපීය ප්‍රාඥයන් අතට පත්වීමෙන් පසු ය.

V. පාණිනිගේ අෂ්ටාධ්‍යායයෙන් නිරූපණය වන සංස්කෘත ව්‍යාකරණය.

VI.
1 භාෂාව විග්‍රහ කිරීමේ ශික්ෂණයේ දී තුලනාත්මක ව භාෂාන්තර ඉතිහාසය අධ්‍යයනය කිරීමේ හැකියාව.
2 ප්‍රත්‍යක්ෂ තොරතුරු පදනම් කර ගනිමින් භාෂාව විග්‍රහ කිරීමේ ශික්ෂණය.
3 තුලනාත්මක භාෂාන්තර ඉතිහාසය අධ්‍යයනය කිරීමේ හැකියාව.

(ලකුණු 02×06 = 12 යි)

(ආ). පහත කරුණු සාරාංශයෙහි අන්තර්ගත විය යුතු ය.

- දහසය වන සියවස වන විට කෝට්ටේ, යාපා පටුන හා කන්ද උඩරට වශයෙන් රාජ්‍යයන් තුනක් මෙරට පැවතුණු බව.
- කලා ඔයේ සිට වලවේ ගඟ දක්වා පැතිර තිබුණු නිරිත දිග ප්‍රදේශය කෝට්ටේ රාජධානියට අයත් ව තිබූ බව.
- එක් එක් ප්‍රදේශ, ප්‍රාදේශීය පාලකයන් මගින් පාලනය වුව ද කෝට්ටේ රජු ලංකාවේ නාමික ආධිපත්‍යය දරා තිබීම.
- ප්‍රාදේශීය පාලකයෝ රජුට කප්පම් ගෙවූ බව.
- ලක්දිව වෙළෙඳාම පාලනය කළ මුස්ලිම්වරුන් ඔවුන්ගේ වෙළෙඳ ද්‍රව්‍ය කෝට්ටේ රාජධානියට අයත් ප්‍රදේශවලින් සපයා ගැනීම.

**ලකුණු විග්‍රහය**

| | | |
|---|---|---|
| අන්තර්ගතය | - ලකුණු | 08 |
| නියමිත වචන ගණන | - ලකුණු | 02 |
| භාෂා නිරවද්‍යතාව | - ලකුණු | 03 |
| මුළු ලකුණු | | 13 |

- * සාරාංශය ලේඛන ව්‍යවහාරයෙන් ලියා තිබිය යුතු ය.
- * එක් ඡේදයක් වන සේ ලියා තිබිය යුතු අතර ඡේදවලට වෙන්කොට ලියා ඇත්නම් සමස්තයෙන් ලකුණු **දෙකක් අඩුවේ.**
- * වචන සංඛ්‍යාව 75 - 85 අතර තිබිය යුතුය .එම ප්‍රමාණය අඩු හෝ වැඩි නම් වචන ප්‍රමාණයට හිමි වන ලකුණු දෙක අහිමි වේ.

3. වචන සංඛ්‍යාව 300 - 350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රදානය කළ හැකිය. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් හෝ ලකුණු 3ක් අඩු කළ යුතු වේ.

   වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

   1. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය.
   2. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම.
   3. කරුණුවල පැහැදිලිබව.
   4. නිවැරදි අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම.
   5. ව්‍යාකරණ දෝෂ රහිත වීම.
   6. භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම.
   7. සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම.
   8. කියවිය හැකි සේ අත් අකුරු පැහැදිලි වීම.
   9. විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)

4. (අ)
   (i) කාන්තාවන් කිහිප දෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩලයට බඳවා ගැනුණ හ.
   (ii) කෘමීන් වගා බිම් විනාශ කරති'යි ගොවියෝ මැසිවිලි නැගූහ.
   (iii) වගකිව යුත්තන් නිහඬව සිටින තාක් සමාජ දූෂකයෝ දුරාචාරයේ යෙදෙත්.
   (iv) බුදුගොස් හිමි මේ දිවයිනට පැමිණ හෙළටුවා පාලියට නැගුවේය/ නැගී ය.
   (v) පෙරදා වට වැස්සෙන් ගෙවල් දොරවල් හා මං මාවත් කැඩී බිඳී ගියේ ය.

   (ආ)
   (i) පන්තිභාර ගුරුතුමා විසින් බොහෝ දෙනා ඉදිරියේ මම පැසසුණෙමි/ පසසන ලදිමි / ලද්දෙමි /පසසනු ලැබීමි/ලැබුවෙමි .
   (ii) මව සහ දුව විසින් උදෑසනින් ම මල් නෙළිණි/නෙළන ලදි.
   (iii) විද්‍යාලයීය ශිෂ්‍ය නායකයන් විසින් දේශකයාගේ අදහස් ඇගයීමට ලක් කරන ලදි /ලද්දේ ය.
   (iv) අප විසින් පසුගිය ඉරු දින පෙරවරුවේ ගමේ විහාරස්ථානයේ දී නුඹලා දකින ලදහු/ දකිනු ලැබුවෙහු.
   (v) කලවැද්දකු විසින් ලේන්නු ද කූඩුව ද ගසින් බිමට ඇද දමනු ලැබෙත්/ දැමෙති.

   (ඉ)
   (i) ලේඛකයකු, විචාරකයෙක්
   (ii) ශිෂ්‍යශිෂ්‍යාවන්, පැවැත්වෙයි
   (iii) දරුවා හෝ දැරිය, කළාය
   (iv) අප, යුතු ය
   (v) දෙමාපියන්/ කරත්

(ලකුණු 05×03 = 15 යි)

5.

| අනු අංකය | පදය | ව්‍යාකරණ අංගය | අනු අංගය |
|---|---|---|---|
| (i) | ප්‍රමුඛාචාර්යවරු | සන්ධි | පූර්ව ස්වර ලෝප සන්ධිය |
| | ශිෂ්‍යසාධනය | සමාස | විභක්ති සමාස |
| | කරති | ක්‍රියා | අවසාන ක්‍රියා |
| (ii) | පවනින් | විභක්ති | කරණ විභක්ති |
| | සැලෙනා | කෘදන්ත | අනතීත කෘදන්ත |
| | සුදිලෙයි | උපසර්ග | වඩා යන අර්ථයේ /අධික යන අර්ථයේ/ අර්ථෝද්දීපනයේ/ භූෂණාර්ථයේ උපසර්ග |
| (iii) | ගේය | ප්‍රත්‍යයාර්ථනාම | කෘදන්ත |
| | පාසා | නිපාත | සියලු යන අර්ථයේ නිපාත /සැම යන අර්ථයේ නිපාත |
| | වී | ක්‍රියා | පූර්ව ක්‍රියා |
| (iv) | තා | නාම | සර්ව නාම |
| | මෙයට | විභක්ති | අවධි විභක්තිය |
| | යි | නිපාත | උද්ධෘත පාඨ දැක්වීමේ නිපාත |
| (v) | ගගනගාමීන් විසින් | විභක්ති | කර්තෘ විභක්තිය |
| | තාරකාවක් | තද්ධිත | අනියමාර්ථ තද්ධිත |
| | කෙරිණි | කෘදන්ත | කර්මකාරක අතීත කෘදන්ත |

(ලකුණු 03×05=15යි)

6. (අ) (i) ප්‍රවෘත්ති (ii) මංගල්‍යය
(iii) පුත්‍රරත්නය (iv) පුවත්
(v) මඟුල (vi) පුත්රුවන

( ලකුණු ½ × 06 = 03 යි)

(ආ) (i) වැල්ලවුරු (ii) රනලියෙව්
(iii) පණකුරු (iv) විද්‍යෝදය
(v) කිරිමැටියාන (vi) ප්‍රත්‍යන්ත

( ලකුණු ½ × 6 = 03 යි)

(ඉ) (i) අවධි විභක්තිය, ආධාර විභක්තිය
(ii) කරණ විභක්තිය, සම්බන්ධ විභක්තිය
(iii) කර්තෘ විභක්තිය, සම්ප්‍රදාන විභක්තිය

(ලකුණු 01 × 03 = 03 යි)

(ඊ). “අහෝ! සුන්දර සන්ධ්‍යාවක නිහඬබව බිඳගෙන, කඳුමුදුනින් ඇසෙන්නේ කුමන නාදයක් ද? විහඟුන්ගේ කව බවය ද? ඈඳ හැලෙන දිය දහරක ගොස ගොසය ද? ” ඔහු විස්මයපත් ව විචාළේ ය.

( ලකුණු ½ × 06 = 03 යි)

(උ). (i) තමා පසුදින කොළඹ යන බව දයාසේන කීවේ ය.
(ii) ගුරුවරයා සිසුන් දෙස බලා ඉදිරි සතියේ වාර විභාගය පැවැත්වෙන බව ප්‍රකාශ කළේ ය.
(iii) එදින අහස බොහෝ ලස්සන බව දරුවෝ කීහ.

(ලකුණු 01 × 03 = 03 යි)

07. (i) ආස්වාදය,චින්තාව,නිර්මාණාත්මක,ලෝකෝපකාරය, විධික්‍රමය, සම්භාව්‍ය, සාගරයක්

(ii) හිතෝපදේශය - කෙටි ඉස්පිල්ල, කොම්බුව ඇලපිල්ල සහ දීර්ඝත්ව ලක්ෂණය / කොම්බුව සහ හල් ඇලපිල්ල / කොම්බුව ඇලපිල්ල සහ හල් ලකුණ, කොම්බුව සහ හල් ලකුණ / කොම්බුව සහ දීර්ඝත්ව ලක්ෂණය

ගැනීමෙන් - කෙටි ඇද පිල්ල /කෙටි ඇදය /ඇක්ම, දීර්ඝ ඉස්පිල්ල, කොම්බුව.

මුනිදාස - කෙටි පාපිල්ල, කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල

(iii) පුරාතන, සාම්ප්‍රදායික, පුරෝගාමී, ප්‍රයෝගයක්. ,කථාවක්, වගන්තියකට, ක්‍රමයක්, සාගරයක් ආස්වාදයක්, කාව්‍යයක්, කෘතියක්, හේතුවක්

(iv) පුරාණෝක්ති. - පුරාණ + උක්ති
බුත්සරණ - බුදු + සරණ
උගත්තු - උගත් + හු

(v) හඳුන්වා

(ලකුණු 3×5=15යි)

**8.** i. අල්පප්‍රාණ අක්ෂර :-

අල්පප්‍රාණ අක්ෂර මහා ප්‍රාණ අක්ෂර වලට සාපේක්ෂව අඩු ශ්වාසයක්/ප්‍රශ්වාස වායු ධාරාවක් උපයෝගිකොට ගනිමින් උච්චාරණය කරන අක්ෂර අල්පප්‍රාණ අක්ෂර ලෙස හැඳින්වේ. සිංහල අක්ෂර මාලාවේ අල්පප්‍රාණ අක්ෂර10 කි. ක, ග, ච, ජ, ට, ඩ, ත, ද, ප, බ යනු එම අක්ෂරයි. ඒ අතුරින් ක , ච , ට , ත , ප යන අක්ෂර අඝෝෂ අල්පප්‍රාණ අක්ෂර වන අතර ග, ජ, ඩ, ද, බ යන අක්ෂර ඝෝෂ අල්පප්‍රාණ අක්ෂර වේ. උච්චාරණ ස්ථාන අනුව ද අල්පප්‍රාණ අක්ෂර වෙනස් වේ.

ක , ග කණ්ඨජ
ච , ජ තාලුජ
ට , ඩ මූර්ධජ
ත , ද දන්තජ
ප , බ ඕෂ්ඨජ

(ලකුණු 05යි )

ii. අන්‍යාර්ථ සමාසය :-

වචන කීපයක් සමාස වූ පසු එම වචනවලින් ගම්‍ය වන අර්ථය ඉක්මවා වෙනස් වූ, අන්‍ය වූ අර්ථයක් ප්‍රකාශ වේ නම් එවැනි සමාසයක් අන්‍යාර්ථ සමාසයක් ලෙස හැඳින්වේ.
උදා :- පත් සියයක් ඇත්තේ නම් එය 'සියපත' වේ. එහෙත්, 'සියපත' යන්නෙන් ගම්‍ය වන්නේ 'නෙළුම් මල ' යන වෙනස්/ අන්‍ය අර්ථයකි.
විභක්ති අර්ථ වශයෙන් සැලකූ විට අන්‍යාර්ථ සමාසයේ ප්‍රභේද හතකි. එනම්,

1. කර්ම විභක්ති අන්‍යාර්ථ සමාසය

උදා :- හංසයා එරුණේ යම් තැනක ද එය 'එරුණුහස්' වේ. එයින් ගම්‍ය වන්නේ 'විල' යන අන්‍යාර්ථයයි. (එරුණු - එරුණා වූ / බැස්සා වූ , හස් - හංසයා)

2. කර්තෘ විභක්ති අන්‍යාර්ථ සමාසය

උදා :- ඉඳුරන් දමනය කරන ලද්දේ යමකු විසින් ද ඔහු 'දැමිඳුරු' නම් වේ. 'දැමිඳුරු' යන්නෙන් ගම්‍ය වන්නේ 'මුනි' යන අන්‍යාර්ථයයි. ( දැමි - දමනය කරන ලද ,ඉඳුරු - ඉන්ද්‍රිය)

3. කරණ විභක්ති අන්‍යාර්ථ සමාසය

උදා :- බත් / ආහාරය සුන් වූයේ හෙවත් නැති වූයේ යමක් කරන කොට ගෙන ද එය 'සුන්බත්' නම් වේ. 'සුන්බත්' යන්නෙන් ගම්‍ය වන්නේ 'කලහය' යන අන්‍ය වූ අර්ථයයි. (සුන්- සුන් වූ /නැති වූ, බත් - බත / ආහාරය)

4. සම්ප්‍රදාන විභක්ති අන්‍යාර්ථ සමාසය

උදා :- වස්ත්‍ර දුන්නේ යමෙකුටද හෙවත් දෙන ලද වස්ත්‍ර ඇත්තේ යමෙකුටද ඔහු 'දුන්වත්' නම් වේ. 'දුන්වත්' යන්නෙන් ගම්‍ය වන්නේ 'බමුණු ' යන අන්‍ය වූ අර්ථයයි. (දුන් දුන්නා වූ /දෙන ලද, වත් - වස්ත්‍ර)

5. අවධි විභක්ති අන්‍යාර්ථ සමාසය

උදා :- ගොනඟුල් ගිලිහුණේ යමකින් ද එය 'ගුලුගොනඟුල්' නම් වේ. 'ගුලුගොනඟුල්' යන්නෙන් ගම්‍ය වන්නේ 'ගස' යන අන්‍ය වූ අර්ථයයි.
(ගුලු - ගිලිහුණු, ගොනඟුල් - වඳුරා)

6. සම්බන්ධ විභක්ති අන්‍යාර්ථ සමාසය

උදා - බල දහයක් ඇත්තේ හෙවත් බල දහයකින් යුක්ත වන්නේ යමෙකුද ඒ 'දසබල' නම් වේ. 'දසබල' යන්නෙන් ගම්‍ය වන්නේ 'බුදුන්' යන අන්‍ය වූ අර්ථයයි. (දස - දහයක් වූ / දහය ,බල - බලයන්/ විශේෂ හැකියාවන්)

7. ආධාර විභක්ති අන්‍යාර්ථ සමාසය

නොයෙකුත් ශූර වීර සෙබළුන් සිටින්නේ යම් ස්ථානයකද එය 'නන්සුරුවිරුබළ' නම් වේ. 'නන්සුරුවිරුබළ' යන්නෙන් ගම්‍ය වන්නේ 'යුදබිම' යන අන්‍ය වූ අර්ථයයි. (නන් -

නොයෙක්, සුරු - ශූර, විරු - වීර, බළ - සෙබළ)
මෙසේ අන්‍යාර්ථ සමාසයට නිදසුන් බොහොමයක් අපගේ සාම්ප්‍රදායික සිංහල ව්‍යාකරණ ග්‍රන්ථයන්හි දැකිය හැකි ය. ඉහත දැක්වූ නිදසුන් විමසන විට කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන, අවධි යන විභක්ත්‍යාර්ථ අන්‍යාර්ථ සමාසවල මුල් පදය කෘදන්ත පදයක් වන බව ද හඳුනාගත හැකි ය.
(මේ සියල්ල අපේක්ෂා නොකෙරෙයි. නිවැරදිව හඳුන්වා උචිත උදාහරණ තුනක් දී ඇත්නම් ලකුණු දෙන්න.)

(ලකුණු 05යි )

iii. නිත්‍ය බහු වචන :-

සෑම විටම බහුවචන අර්ථයේ පමණක් භාවිත වන ඒකවචන අර්ථයේ භාවිත නොවන නාම පද නිත්‍ය බහුවචන ලෙස හැඳින්වේ. ඇතැම් විට එවැනි පද රූපයෙන් ඒකවචනාර්ථයක් පෙන්නුම් කළ ද එහි ඇත්තේ බහුවචනාර්ථයක් වන අතර නිත්‍ය බහුවචනයක් උක්තය ලෙස යෙදේ නම් එවැනි සෑම අවස්ථාවක ම ආඛ්‍යාතය ද බහුවචනයෙන් තැබිය යුතු ය.

උදා :- අයෙක්, කෙනෙක්, කිසිවෙක්, යමෙක්, කවරෙක්

මේවා බැලූ බැල්මට ඒක වචනාර්ථ නාම පද ලෙස පෙනෙතත් බහුවචනාර්ථ ගනියි. 'අයෙක් පාඩම් කියවති' 'කෙනෙක් බුදුන් වඳිති' 'කිසිවෙක් ශාලාවෙහි සිටිති' 'යමෙක් මිදුල පිරිසිදු කරති' 'කවරෙක් හොඳින් සවන් දෙත් ද' ආදි වශයෙනි.
නිත්‍ය බහුවචන උක්ත සහ අනුක්ත අර්ථයන්හි වරනැගෙන අයුරු පහත දැක්වේ.

| **උක්ත රූපය** | **අනුක්ත රූපය** |
|---|---|
| අයෙක් | අයෙකු |
| කෙනෙක් | කෙනෙකු |
| කිසිවෙක් | කිසිවෙකු |
| යමෙක් | යමෙකු |
| කවරෙක් | කවරෙකු |
| ඇතැමෙක් | ඇතැමෙකු |
| සමහරෙක් | සමහරෙකු |
| කවුරු | කවුරුන් |

(ලකුණු 05යි )

iv. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා :-

කිසියම් ක්‍රියාවක් සිදුවීමේ කාලය පිළිබඳ කියවෙන ක්‍රියා කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා නම් වේ.
මෙම ක්‍රියා ද අනවසාන ක්‍රියා ගණයට අයත් වේ. උදා :- කුකුළන් '**<u>හඬලද්දී</u>**' නිවැසියෝ අවදි වූහ.
ඉහත වාක්‍යයේ 'හඬලද්දී' යන ක්‍රියා පදයෙන් නිවැසියන් අවදි වූ කාලය පිළිබඳ ප්‍රකාශ කෙරේ. එසේම එය අනවසාන ක්‍රියාවක් බව ද එම වාක්‍යයෙන් පැහැදිලි වේ.
තවද කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා කාල, පුරුෂ ,සංඛ්‍යා,ලිංග භේදයන්හි වර නොනැගේ.
ක්‍රියා ප්‍රකෘතියට ගන්වන ප්‍රත්‍යය අනුව කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා ස්වරූප කිහිපයකින් භාවිත වේ.

උදා:-

| ප්‍රත්‍ය | | ක්‍රියා රූපය |
|---|---|---|
| ත | | බලන |
| ත් | | බලත් |
| ත්දී (ද්දී ) | | බලද්දී |
| | | |

(ලකුණු 05යි)

v ද්විත්ව රූප සන්ධිය :-

පද දෙකක් සන්ධි වීමේ දී පූර්ව පදයේ අග ඇති ව්‍යඤ්ජන ශබ්දය ද්විත්ව වීමෙන් එම පද දෙකෙහි ශබ්ද සංවිධානය වීම ද්විත්ව රූප සන්ධිය ලෙස හැඳින්වේ.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උදා:- | රුක් | + | අත්තන | කොස් | + | ඇට |
| | රු (ක් ×2) | + | අත්තන | කො (ස්×2) | + | ඇට |
| | රුක් ක් | + | අත්තන | කොස් ස් | + | ඇට |
| | | රුක්කත්තන | | | කොස්සැට | |

ඇතැම් අවස්ථාවල දී පූර්ව පදයේ අග ඇති අක්ෂරයේ ස්වර ශබ්දය ලොප් වී ඉතිරි වන ව්‍යඤ්ජන ශබ්දය ද්විත්ව වීමෙන් මෙම සන්ධිය සිදුවන අවස්ථා ද ඇත.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උදා:- | කොලු | + | ආ | කෙකි | + | අ |
| | කො (ල් ) +උ | + | ආ | කෙ(ක් ) +ඉ | + | අ |
| | කො(ල්×2 ) | + | ආ | කෙ(ක්×2 ) | + | අ |
| | කොල්ල් | + | ආ | කෙක්ක් | + | අ |
| | | කොල්ලා | | කෙක්ක | | |

(ලකුණු 05යි)